# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව: කාර්යභාරය හා පැමිණිලි විමර්ශනය පිළිබඳ අධ්‍යයනය

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව: කාර්යභාරය හා පැමිණිලි විමර්ශනය පිළිබඳ අධ්‍යයනය

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2023 මැයි

***දායකත්වය***

රචනය:
නීතීඥ පුබුදු රන්දිම, නීතීඥ ලක්ෂාන් ප්‍රනාන්දු

සංස්කරණය:
අජිත් පැරකුම් ජයසිංහ

ප්‍රකාශනය:
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

මුද්‍රණය:
ඇඩ්ආර්ට්ස් - මහරගම

ව්‍යාපෘති කළමනාකරණය:
දිනිති සුපේක්ෂලා

# පටුන


පෙරවදන 4

හැඳින්වීම 5

අධ්‍යයනයේ අරමුණු 6

අධ්‍යයනයේ සීමා 6

අධ්‍යයන ක්‍රමවේදය 6

**1. පසුබිම** 7

**2. 1996 අංක 21 දරන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සභා පනත** 10

**3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව** 11

**4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය** 18

**5. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සහ නිර්දේශ පිළිබඳ විශ්ලේෂණය** 21

5.1 වර්ෂ 2021 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන් 21

5.2 වර්ෂ 2022 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන් 25

5.3 2022 මැයි මස සිට 2023 අප්‍රේල් මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කළ පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය 28

**නිර්දේශ** 32

# පෙරවදන

ශ්‍රී ලංකාව 1956 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විශ්ව ප්‍රකාශණය අනුමත කළාය. මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ශ්‍රී ලංකාවේ කැපවීම ප්‍රදර්ශනය කිරීමේ අරමුණෙන් මෙම වැදගත් පියවර තබා මේ වන විට වසර 67ක් ගතව තිබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළුව මූලික නීති ගණනාවක් හරහා ඉහත විශ්ව ප්‍රකාශණයේ සඳහන් මානව අයිතිවාසිකම් ශ්‍රී ලංකා නීතියට ඇතුළත් කර ඇත. මෙයින් අදහස් කරන්නේ මානව හිමිකම් ප්‍රඥප්තියෙහි මූලධර්ම කෙරෙහි ශ්‍රී ලංකා රජය නීත්‍යානුකූලව බැඳී ඇති බවයි.

ශ්‍රී ලංකාව තුළ සිදු වන මානව හිමිකම් කඩවීම් පිළිබඳව විමර්ශනය කිරීම, සුරක්ෂිත කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1997 දී පිහිටුවන ලදී. මහජනතාව අතර මානව හිමිකම් පිළිබඳ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීමත් මෙම ආයතනයේ වගකීම් අතර වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනතින් ස්ථාපිත වූ වගකිව යුතු ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයකි.

මෙම කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ හා මාර්ගෝපදේශ රජයට ලබාදීම සිදු කරනු ලබයි. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කරන අතර මෙම උල්ලංඝනයන්ට ගොදුරු වූවන්ට යුක්තිය ඉටු කිරීම සහතික කිරීමට කටයුතු කරයි.

ප්‍රාදේශීයව පිහිටුවා තිබෙන මෙහි කාර්යාල ද ඉතා වැදගත්ය. එහෙත්, කොමිෂන් සභාවට එහි වරම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සම්පත් නොමැත. එම නිසා, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට හෝ මෙම උල්ලංඝනයන්ට ගොදුරු වූවන්ට ආධාර සැපයීමට කොමිසමට බොහෝ විට නොහැකි වේ. කොමිෂන් සභාව පිළිබඳ ප්‍රමාණවත් මහජන අවබෝධයක් නොමැතිකම ද තවත් ගැටලුවකි.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වැඩිදියුණු කළ යුතු ආකාරය පිළිබඳව කොමිෂන් සභාව විසින් ඉතා වැදගත් නිර්දේශ හා මාර්ගෝපදේශ රජය වෙත ඉදිරිපත් කර ඇත.

මානව හිමිකම් ගරු කරන ශ්‍රී ලංකාවක් සඳහා අඛණ්ඩව කටයුතු කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඇති කැපවීම සාක්ෂි සහිතව විශ්ලේෂණය කිරීම සහ ඇගයීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. එය මෙහෙයවූ සුනෙත් ගජනායක මහතාටත්, තම අත්දැකීම් නොමසුරුව බෙදාහදාගත් මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානවලට හා වෙනත් ආයතන හා පුද්ගලයන්ටත්, සංස්කාරකවරුන්ට, පරිවර්තකයන්ට හා රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයටත් මගේ ප්‍රණාමය හිමි වේ.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂක,
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

20/05/2023

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම, වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවට සැලකිය යුතු කාර්යභාරයක් පැවරී තිබේ. 1996 අංක 21 දරන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභා පනත හරහා ස්ථාපිත මානව හිමිකම් කොමිෂන් සභාව 1997 වර්ෂයේ ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වී මේ වන විට වසර විසිහයක් (26) සම්පූර්ණ කර තිබේ.

කොමිසම සඳහා කොමසාරිස්වරුන් පත්වීමේ ක්‍රියාපටිපාටිය, කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය ජාත්‍යන්තර ප්‍රමිතීන් මත සිදු නොවීම මත අවස්ථා කිහිපයකදී මානව හිමිකම් කොමිෂන් සභාව ඒ ශ්‍රේණියේ සිට බී ශ්‍රේණිය දක්වා පහත දැමීම, කොමිසම වෙත ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සිදු කර නිර්දේශ ලබා දීමට ගත කරනු ලබන කාලය, එවැනි විශාල කාලයක් මිඩංගු කර ලබාදෙන නිර්දේශ සමහර රාජ්‍ය ආයතන හෝ නිලධාරීන් විසින් ක්‍රියාත්මක නොකිරීම, අයිතිවාසිකම් කඩ වූ වින්දිතයින් මේ වෙනුවෙන් මිඩංගු කරන කාලය හා මුදලට සාපේක්ෂව කොමිසම ලබාදෙන නිර්දේශ ප්‍රමාණවත් නොවීම හා කොමිසම පිළිබඳ තිබූ මහජන විශ්වාසය ක්‍රමයෙන් හීන වී යාම මේ මොහොතේ කොමිසම කෙරෙහි ඇති විවේචනයන් ලෙස හැඳින්විය හැක.

නමුත්, මේ අතර පැමිණිල්ලක් ඇතිව හෝ නොමැතිව රට තුළ නිර්මාණය වූ මානව හිමිකම් උල්ලංඝනයවීම් සම්බන්ධව වහා මැදිහත් වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ඊට අදාල ප්‍රධාන පාර්ශවකරුවන් ගෙන්වා විමර්ශන පැවැත්වීම හා අදාල නිර්දේශ නිකුත් කිරීම, වදහිංසාව හා නීති විරෝධී ඝාතන සම්බන්ධව ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ ඒකකයක් ස්ථාපිත කිරීම, පොලිස් ස්ථාන පරීක්ෂාව විධිමත් කිරීම, ගොඩ ගැසී ඇති මහජන පැමිණිලි විමර්ශනයන් වේගවත් කිරීම, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිර්දේශ, නිවේදන හා මාර්ගෝපදේශ නිකුත් කිරීම වැනි ක්‍රියාමාර්ග ඉහත විවේචන යම් පමණකට අස්වැසීමට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම, ශක්තිමත් හා කාර්යක්ෂම ආයතනයන් නිර්මාණය කිරීම, මානව හිමිකම් කොමසාරිස්වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ පත්වීම්, මාරු කිරීම් හා උසස්වීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව ස්වාධීන ක්‍රියාපටිපටියක් හරහා සිදු කිරීමට, ඒ පිළිබඳව මහජන සංවාදය තවදුරටත් පුළුල් කර ගැනීම, ඒ හරහා අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරන පුරවැසියන්ගේ සහභාගීත්වය තව දුරටත් වර්ධනය කර ගැනීම අරමුණු කරමින් මෙම ප්‍රකාශනය ඔබ අතට පත් කිරීමට අප තීරණය කළෙමු.

# අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වන්නේ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් බලාත්මක කර ඇති මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳ විශ්ලේෂණය සහ අධ්‍යයනය කිරීමත්, ඒ හරහා අඩුලුහුඩුකම් හඳුනා ගනිමින් මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් සහ කාර්යක්ෂම කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමත් ය. එමෙන්ම හඳුනාගනු ලබන සාධනීය ලක්ෂණ අගය කිරීමටත්, පුරවැසියන් හට මුහුණපෑමට සිදුවන ප්‍රායෝගික ගැටලු ඉස්මතු කිරීමටත් සහ මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැනුවත්භාවය පුළුල් කරමින් ඔවුන් බල මුළු ගැන්වීමටත් මෙම අධ්‍යයනය මගින් අපේක්ෂිත ය.

# අධ්‍යයනයේ සීමා

මෙහිදී අප මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි යොමු කරමින් ඒ පැමිණිලි කෙරෙහි කොමිසමේ ක්‍රියාකාරිත්වය කෙසේ ද යන්න පිළිබඳ අධ්‍යනය කළ අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වෙබ් අඩවියට නිකුත් කර ඇති පැමිණිලිවල දත්තයන් ද්විතීයික දත්තයන් ලෙස විශ්ලේෂණය සඳහා භාවිතා කෙරිණි. ඒ අනුව අධ්‍යයනයේදී හුදෙක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන පැමිණිලි ලියාපදිංචි කර විමර්ශන කටයුතු ආරම්භ කිරීම සහ විමර්ශන අවසන් කර නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටිය දක්වා ම මෙම අධ්‍යයනය ව්‍යාප්ත වන බව සඳහන් කළ යුතු ය.

අධ්‍යයනය සිදු කිරීමේදී අප මුහුණ දුන් ප්‍රධාන ගැටලුව වන්නේ අපගේ මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා මානව හිමිකම් කොමිසම වෙත පැමිණිලි යොමුකළ ඇතැම් වින්දිතයන්ගෙන් එම පැමිණිල්ලේ විමර්ශනවල වත්මන් තත්ත්වය විමසීමට දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් උත්සහ කළද, එම උත්සහය ව්‍යාර්ථ විය. ඒ හරහා යොමුකළ පැමිණිලි කිහිපයකම වත්මන් තත්ත්වය පිළිබඳ නිරවද්‍ය තොරතුරු ලබා ගැනීමට අපට නොහැකි විය.

# අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී යොදා ගනු ලැබූ ක්‍රමවේදය වූයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාවය සහ ස්වාධීනත්වය පිළිබඳ සඳහන් ව ඇති වාර්තා, පුවත් පත් ලිපි, 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ලබා ගත් තොරතුරු, කොමිෂන් සභාවේ වෙබ් පිටුවෙන් ලබා ගත් දත්ත සමූහයන් සහ සම්මුඛ සාකච්ඡා හරහා ලබා ගන්නා ලද තොරතුරු ඒකරාශී කර ඒවා පුළුල් වාර්තාවක් තුළ සංශ්ලේෂණය කර ඉන් අනතුරුව විශ්ලේෂණය කිරීමයි. එහිදී ප්‍රාථමික දත්ත වශයෙන්, සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් තොරතුරු සහ ගාල්ල, මාතර, ගම්පහ, කුරුණෑගල, පුත්තලම සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් පුරා විහිදී ඇති මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන හරහා විවිධාකාරයෙන් තම මානව හිමිකම් කඩ වූ පුද්ගලයින් මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය කාර්යාල වෙත (2022) මැයි මස සිට (2023) අප්‍රේල් මස දක්වා යොමු කළ පැමිණිලි 50ක් මෙම අධ්‍යයනයට මූලික වශයෙන් පදනම් කොට ගෙන ඇත. එමෙන්ම මෙම වාර්තාවේ අනෙකුත් සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍ය වාර්තා, මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් පිටුවේ දත්ත සමූහයන්, මානව හිමිකම් කොමිෂන් සභා පනතේ තොරතුරු සහ වෙනත් ලියකියවිලිවල වල ද්විතීයික දත්තයන් මත විශ්වාසය තැබී ය.

# 01 | පසුබිම

## 01. මානව හිමිකම් යාන්ත්‍රණය

වර්ෂ 1945 ඔක්තෝම්බර් මස 24 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරම්භයත් සමඟ මානව හිමිකම් පිළිබඳව ලෝකය තුළ නව ප්‍රබෝධයක් හට ගන්නා ලදී. වර්තමානයේ දී මානව හිමිකම් අධීක්ෂණය, ප්‍රවර්ධනය, ආරක්ෂණය කිරීමට සහ ඒ පිළිබඳව උපදෙස් ලබා දීම සඳහා විවිධ වූ මානව හිමිකම් ආයතන සහ ක්‍රියාකාරකම් විශාල වශයෙන් බිහි වී ඇත. වර්ෂ 1948 දෙසැම්බර් මස 10 වන දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළිදැක්වීමෙන් පසුව එය පදනම් කරගනිමින් විවිධ වූ ජාත්‍යන්තර ගිවිසුම් සහ කලාපීය ගිවිසුම් ඇති කරගනු ලැබූ අතර, එය ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට ඉවහල් විය. පසුව, රාජ්‍යයන් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ඔවුන්ගේ නීතීන්ට ඇතුළත් කර දේශීය මානව හිමිකම් යාන්ත්‍රණයන් ස්ථාපිත කරන ලදී.

මානව හිමිකම් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණ පහත පරිදි වේ.

1.1 අන්තර්ජාතික යාන්ත්‍රණ

1.2 කලාපීය යාන්ත්‍රණ

1.3 දේශීය යාන්ත්‍රණ

### 1.1 අන්තර්ජාතික යාන්ත්‍රණ

මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගෝලීය සැලැස්මක් නිර්මාණය කර ඇත. අන්තර්ජාතික මානව හිමිකම් නීති සම්පාදනය සඳහා මුළු ලොවම පිළිගත් අන්තර්ජාතික අධිකරණ බලය සහිත එකම බහුපාර්ශවීය රාජ්‍ය සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය වේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආරක්ෂණ පද්ධතිය ප්‍රධාන අංග තුනකින් (03) සමන්විත වේ.

- ප්‍රඥප්ති, ගිවිසුම්, ප්‍රකාශන සහ ලිපි ලේඛන මගින් අන්තර්ජාතික ප්‍රමිති ස්ථාපිත කිරීම.
- විශේෂ වාර්තාකරුවන්, ප්‍රවීණයින් සහ ක්‍රියාකාරී කාණ්ඩායම්, කමිටු සහ ගිවිසුම්ගත සංවිධාන වැනි කණ්ඩායම් සඳහා විවිධ කටයුතු පරීක්ෂා කිරීමට බල අධිකාරයන් ලබා දීම.
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ උපදේශක සේවාවන් සහ තාක්ෂණික සහාය පිරිනැමීම.

මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලබාදෙන ආරක්ෂණ ක්‍රමය සඳහා පහත සඳහන් දෑ පදනම් කර ගනී.

1.1.1 ප්‍රඥප්ති පදනම් කරගත් යාන්ත්‍රණය - එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති පදනම් කර ගනිමින් පිහිටුවන ලද ආයතන හරහා මානව හිමිකම් ආරක්ෂා කිරීමට යොදාගනු ලබන යාන්ත්‍රණ, ප්‍රඥප්ති පදනම් කරගත් යාන්ත්‍රණ වේ.

1.1.2 ගිවිසුම් පදනම් කරගත් යාන්ත්‍රණය - එක්සත් ජාතීන් විසින් ඇතිකරගත් ගිවිසුම් අනුව පිහිටුවන ලද ආයතන හරහා මානව හිමිකම් ආරක්ෂා කිරීමට යොදා ගන්නා යාන්ත්‍රණ, ගිවිසුම් පදනම් කරගත් යාන්ත්‍රණ වේ.

### 1.2 කලාපීය යාන්ත්‍රණ

මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ක්‍රමවේදයෙහි ඉතා වැදගත් කොටස් කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන්හි අඩංගු වේ. කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයක් යනු මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත භූගෝලීය කලාපයක් තුළ ස්ථාපිත පද්ධතියක් හෝ ආයතනයකි. මෙම යාන්ත්‍රණයන් ජාත්‍යන්තර මානව හිමිකම් රාමු සමඟ ක්‍රියා කරන නමුත් ඔවුන්ගේ අදාළ කලාප තුළ මානව හිමිකම් ගැටලු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරයි. මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම, කලාපීය අභියෝග ආමන්ත්‍රණය කිරීම සහ සාමාජික රටවල් අතර සහයෝගීතාවය සහ සංවාදය සඳහා වේදිකාවක් සැපයීම සඳහා ඔවුන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

නිශ්චිත කලාපීය සන්දර්භයන් සහ අවශ්‍යතා සඳහා ප්‍රතිචාරයක් ලෙස කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණයන් මතු වී ඇත. ප්‍රමුඛ කලාපීය මානව හිමිකම් යාන්ත්‍රණ සඳහා උදාහරණ කිහිපයක් මෙහි දැක්වේ.

| කලාපය | ස්ථාපිත පද්ධතිය හෝ ආයතනය |
|---|---|
| අප්‍රිකානු කලාපය | ■ මානව හිමිකම් සහ ජනතා අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු කොමිසම<br>■ මානව හිමිකම් සහ ජනතා අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු අධිකරණය |
| ඇමෙරිකානු කලාපය | ■ මානව හිමිකම් පිළිබඳ අන්තර් ඇමෙරිකානු කොමිසම<br>■ අන්තර් ඇමෙරිකානු මානව හිමිකම් පිළිබඳ අධිකරණය<br>■ අන්තර් ඇමෙරිකානු කාන්තා කොමිසම |
| යුරෝපා කලාපය | ■ යුරෝපා සභාව<br>■ මානව හිමිකම් පිළිබඳ යුරෝපා අධිකරණය |
| අරාබිය | ■ අරාබි මානව හිමිකම් කමිටුව |
| අග්නිදිග ආසියානු කලාපය | ■ අග්නිදිග ආසියානු ජාතීන්ගේ එකමුතුවේ අභ්‍යන්තර රාජ්‍ය මානව හිමිකම් කොමිෂන් සභාව |

### 1.3 දේශීය යාන්ත්‍රණ

රටක් තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සහතික කිරීමට මානව හිමිකම් යාන්ත්‍රණයක් තිබීම ඉතා වැදගත් වේ. එය මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් ඔවුන් වගවීම සහ ජාතික සහ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීම අධීක්ෂණය කිරීම, රජය පරීක්ෂා කිරීමක් ලෙස ක්‍රියා කරයි. පැමිණිලි විමර්ශනය කිරීම සහ පිළියම් ලබා දීමෙන්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා සහන සොයන පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට අවශ්‍ය මාර්ග සපයයි. මෙවැනි ජාතික යාන්ත්‍රණයක් මානව හිමිකම් ප්‍රමිතීන් සහ ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම, පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ රට තුළ මානව හිමිකම්වලට ගරු කිරීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. දේශීය වශයෙන් මූලික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා සහ එම අයිතිවාසිකම් උල්ලංඝනයවීම්වලදී ඒවා ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ප්‍රධාන ආයතන පහත පරිදි වේ.

1.3.1 ශ්‍රේෂ්ඨාධිකරණය

1.3.2 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)

1.3.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

#### 1.3.1 ශ්‍රේෂ්ඨාධිකරණය

- ඉහළම සහ අවසානාත්මක අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය වන අතර, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව එහි බලතල ක්‍රියාත්මක කිරීමට බලය ඇත.

- විධායක හෝ පරිපාලන ක්‍රියාවක් හේතුවෙන් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයවීමක් හෝ උල්ලංඝනයවීමට අත්‍යාසන්න අවස්ථාවකදී යම් පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට හිමිකම් ඇති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා ඇත.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීම හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාගකොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති බවට දක්වා ඇත.

### 1.3.2 පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්)

- රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ වෙනත් සමාන ආයතනයක නිලධරයකු විසින් ගනු ලබන පරිපාලනය සඳහා වන සහන ලබාගත හැකි ප්‍රධාන ආයතනයක් ලෙසට පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් හෙවත් ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය සැළකිය හැකි ය.

### 1.3.3 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වර්ෂ 1996 අගෝස්තු මාසයේ ඉදිරිපත් කරන ලද පාර්ලිමේන්තු පනතක් යටතේ නිර්මාණය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

- ඊට අදාළ පනත වන්නේ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතයි.

# 02 | 1996 අංක 21 දරන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සභා පනත

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත, HRCSL පනත ලෙස ද හැඳින්වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස මෙම පනත මගින් ස්ථාපිත කර ඇත. එසේම කොමිසමේ ව්‍යුහය, ක්‍රියාකාරකම් සහ බලතල පනත මගින් දක්වා ඇත.

එම පනතේ පූර්විකාවේ සඳහන් කර ඇත්තේ මෙසේ ය.

"ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය නියම කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි."[1]

සමස්තයක් වශයෙන්, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීම, කාර්යයන් සහ බලතල සඳහා නීතිමය රාමුව සපයන අතර, රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට සහ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් වගවීම සහතික කිරීමට එය බල ගන්වයි.

1. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

# 03 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ අරමුණ

අන්තර්ජාතික සහ කලාපීය වශයෙන් මානව හිමිකම් යාන්ත්‍රණ ස්ථාපිත වීමත් සමඟ රාජ්‍යයන් තම නීති පද්ධතියට ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ඇතුළත් කර දේශීය මානව හිමිකම් යාන්ත්‍රණය නිර්මාණය කරන ලදී. 1991 දී පැරිසියට එක් රැස් වූ රාජ්‍යයන් විසින් ගොඩ නඟා ගත් පැරිස් මූලධර්මයන් සහ ස්වාධීන මානව හිමිකම් කොමිෂන් සභා පිහිට විය යුතුය යන නිර්දේශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල දේශීය යාන්ත්‍රණය විධිමත් කිරීමට හේතු සාධක විය. ඒ අනුව වර්ෂ 1996 අගෝස්තු මස 21 වන දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බලාත්මක විය.[2] ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය වර්ෂ 1997 ජූලි මාසයේ දී ආරම්භ විය.

## මානව හිමිකම් කොමිෂන් සභා පනතට අනුව මානව හිමිකම් නිර්වචනය

ආර්ථික, සමාජ සහ සංස්කෘතික වශයෙන් සහ සිවිල් සහ දේශපාලනික වශයෙන් ජාත්‍යන්තරව ප්‍රකාශයට පත් සහ පිළිගත් සම්මුතීන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතට අනුව මානව හිමිකම් ලෙස නිර්වචනය කෙරෙයි.[3]

**දැක්ම**

සැමට මානව හිමිකම් සහතික කිරීම සහ
නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.


**මෙහෙවර**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කෙරෙහි
විශේෂ අවධානයක් යොමු කරමින් විශ්වීය වශයෙන් පිළිගත් මානව හිමිකම් ප්‍රමිතීන් සහ
මූලධර්මවලට අනුකූලව නීතියෙන්, ප්‍රතිපත්තිවලින් සහ ප්‍රායෝගිකව ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ
මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම්
සංස්කෘතියක් වර්ධනය කිරීම.

2. https://www.samabima.com/?p=21589

3. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

## කොමිෂන් සභාවේ සංයුතිය සහ ධූර කාලය




- කොමිෂන් සභාව මානව හිමිකම්වලට අදාළ කාරණා සම්බන්ධයෙන් දැනුමක් හෝ ප්‍රායෝගික පළපුරුද්දක් ඇති සාමාජිකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වේ.
- කොමිෂන් සභාවේ සාමාජිකයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කෙරේ.
- එම නිර්දේශයන් මගින් සුළු ජාතීන් ද නියෝජනය කිරීමක් සිදු විය යුතු ය.
- එම සාමාජිකයන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් නම් කළ යුතු ය.
- කොමිෂන් සභාවේ සභාපතිවරයා එහි ප්‍රධාන විධායක නිලධාරියා වේ.
- සෑම සාමාජිකයෙකුම අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු ය.

## වර්තමාන සාමජිකයින්

- විනිසුරු රෝහිණී මාරසිංහ - සභාපතිනිය
- කළුපහන පියරතන හිමි
- ආචාර්ය එම්. එච්. නිමල් කරුණාසිරි
- ආචාර්ය විජිත නානායක්කාර
- අනුසූයා ශන්මුගනාතන්
- ආචාර්ය ජගත් බාලසූරිය - සභාපති (වර්ෂ 2020 දෙසැම්බර් 10 සිට 2021 ඔක්තෝම්බර් 31 දක්වා)
- එච්. කේ. නවරත්න වේරදූව - කොමසාරිස් (වර්ෂ 2020 දෙසැම්බර් 10 සිට 2021 ඔක්තෝම්බර් 11 දක්වා)

## කොමිෂන් සභාවෙහි මූලික කාර්යයන්

(අ) මූලික අයිතිවාසිකම් අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම.

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත් කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම.

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම.

(ඈ) ජාතික නීති සහ පරිපාලනමය පිළිවෙත් ජාත්‍යන්තර මානව හිමිකම්වලට, නියමයන්ට හා සම්මතවලට අනුකූල බව සහතික කිරීම පිණිස ගත යුතු පියවර සම්බන්ධයෙන් ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඉ) මානව හිමිකම් ක්ෂේත්‍රයේදදී ගිවිසුම්වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායක වීමේ හා එකගවීමේ අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ

(ඊ) මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම හා අයිතිවාසිකම්වලට අනුකූලව අධ්‍යාපනයක් සැලසීම.[4]

## කොමිෂන් සභාවෙහි බලතල

(අ) මූලික අයිතිවාසිකම් පිළිබඳ යම් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනයට අත්‍යාසන්න වීම පිළිබඳව විමර්ශනය කිරීම.

(ආ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පළාත්සභා මට්ටමේ උපකමිටු පත් කිරීම.

(ඇ) යම් අධිකරණයක් ඉදිරියේ විනිශ්චයට භාජනයව පවතින මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නවීමට අදාළව වූ යම් නඩු කටයුතුවලට එම අධිකරණයේ අවසරය ඇතිව මැදිහත් වීම.

(ඈ) අධිකරණ ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් රඳවාගෙන සිටින තැනැත්තන්ගේ සුබසිද්ධිය උදෙසා ඔවුන් රඳවාගෙන සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීම, සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවාගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඉ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගත යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි පියවර ගැනීම.

(ඊ) මානව අයිතිවාසිකම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සහ වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීමෙන් මානව අයිතිවාසිකම් පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම සහ එම පර්යේෂණයන්වල ප්‍රතිඵල ප්‍රචාරණය කිරීම සහ බෙදා දීම.

(උ) කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමේදී පැමිණිලිකරු විසින් සාධාරණව දරණ ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාවේ පරම අභිමතය පරිදි ප්‍රදානය කිරීම.

(ඌ) කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.[5]

4. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

5. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

| | |
|---|---|
| පුද්ගලයන්ට කොමිසම වෙත ඉදිරිපත් කළ හැකි පැමිණිලි වර්ගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 03 වන පරිච්ඡේදය මගින් පිළිගත් මූලික අයිතිවාසිකම් කඩවීම් සහ කඩවීමට අත්‍යාසන්න අවස්ථාවලදී පැමිණිලි ඉදිරිපත් කළ හැකියි. |
| කොමිසම සඳහා පැමිණිලි ඉදිරිපත් කළ හැකි පිරිස් | පීඩාවට පත් පුද්ගලයන්ට, පුද්ගල කණ්ඩායම්වලට, පුද්ගලයෙක්/පුද්ගල කණ්ඩායමක් හෝ පීඩාවට පත් යම් පුද්ගල කණ්ඩායමක් වෙනුවෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. |
| පැමිණිලි ඉදිරිපත් කළ හැකි භාෂාව | සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකියි. |
| පැමිණිලි කිරීමකින් තොරව කරුණු විමර්ශනය කිරීමේ හැකියාව | මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකදී, කිසිදු පැමිණිලි කිරීමකින් තොරව කරුණු විමර්ශනය කිරීමට සහ විමසීමට කොමිසමට පුළුවන.<br>උදා:<br>■ මාතර, මිදෙල්ලවල ප්‍රදේශයේදී පොලිස් වෙඩි පහරින් පාසල් ශිෂ්‍යයෙකු තුවාල ලැබීමේ සිදුවීම.<br>■ රඹුක්කන ප්‍රදේශයේ උද්ඝෝෂනයක් අතරතුරදී පොලිස් වෙඩි පහරින් පුද්ගලයෙකු මිය යාම පිළිබඳ සිදුවීම.<br>■ මහර බන්ධනාගාරය තුළදී රැඳවියන් පිරිසක් මියයාම හා සම්බන්ධ සිදුවීම.<br>■ රත්ගම ප්‍රදේශයේදී ව්‍යාපාරිකයින් දෙදෙනෙකු පැහැරගැනීම සහ ඔවුන්ව නීතිවිරෝධීව ඝාතනය කිරීම පිළිබඳ සිදුවීම.<br>■ බුර්කාවන් ඇඳසිටි ගර්භණී මවුවරුන්ට අටුළුගම ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය සායනට ඇතුල්වීමට ඉඩ නොදීම සම්බන්ධ සිදුවීම. |
| ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි සම්බන්ධව වාර්තා කිරීමේ හැකියාව | සමහර අවස්ථාවලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැමිණිලි සම්බන්ධව විමර්ශනය කොට ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වාර්තා කරන ලෙස කොමිෂන් සභාවට දන්වයි. |
| පැමිණිල්ලක අඩංගු විය යුතු කරුණු | ➢ උල්ලංඝනය වී ඇති අයිතිවාසිකම කුමක්ද?<br>➢ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්තේ කාගේද?<br>➢ අයිතිවාසිකම් හෝ හිමිකම් උල්ලංඝනය සඳහා වගකිව යුත්තේ කවුරුන්ද?<br>➢ අයිතිවාසිකම් උල්ලංඝනය වූයේ කවරාකාරයෙන්ද?<br>➢ අයිතිවාසිකම් උල්ලංඝනය වූයේ කවදාද? කොතැනකදීද?<br>➢ ප්‍රතිකර්ම ලෙස ඔබ බලාපොරොත්තු වන්නේ මොනවාද? |
| පැමිණිලි ඉදිරිපත් කිරීමට නීතිමය නියෝජිතයෙකු රැගෙන වීම | නීතිමය නියෝජිතයෙකු ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය නැත. |
| පැමිණිලි කොමිෂන් සභාව යටතට නොගැනෙන විට ඒයට සිදුවන දේ | රජය විසින් ස්ථාපිත කර ඇති ප්‍රතිකර්ම ලබාදෙන අදාළ ආයතන වෙත එම පැමිණිලි යොමු කරනු ලබයි. |
| අයිතිවාසිකම් උල්ලංඝනය වී දීර්ඝ කාලයක් ගතවීමෙන් පසුව පැමිණිලි කිරීම | සාධාරණ හේතු මත මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී දීර්ඝ කාලයක් ගත වූ පසු ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳව සොයා බැලීමට හැකියාවක් ඇත. |

| | |
|---|---|
| කොමිෂන් සභාවෙහි සේවාවන් නොමිලේ ලබා ගැනීමට හැකියාව | කොමිෂන් සභාව මගින් කරන සියලුම සේවාවන් නොමිලේ ලබා ගත හැකිය. |
| යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද අවස්ථාවකදී කොමිෂන් | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෝ මහජන ආරක්ෂක ආඥා පනත යටතේ සාදන ලද නියෝගයක් යටතේ යම් තැනැත්තෙකු සිරභාරයට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද අවස්ථාවකදී ඒ පිළිබඳවද, එම තැනැත්තන් අත්අඩංගුවේ හෝ රඳවා ගෙන ඇති ස්ථානය පිළිබඳවද, එලෙස සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීමේ ආඥාව කරනු ලැබූ තැනැත්තා විසින් සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම කරනු ලැබූ වේලාවේ සිට පැය 48ක් ඇතුළත කොමිෂන් සභාවට වහාම දැනුම් දිය යුතුය.[6]<br><br>තවද, එලෙස අත් අඩංගුවට ගන්නා ලද තැනැත්තෙකු මුදා හරිනු ලැබීම හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරනු ලැබූ අවස්ථාවකදී ද ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.<br><br>මෙය පැහැර හරින යම් අයෙකු මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු වූ විට සිරදඬුවම් හෝ දඩයකට යටත් කළ හැකිය.<br><br>කොමිෂන් සභාව විසින් රැඳවුම් ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට හෝ වෙනත් යම් ස්ථානයකට ඇතුල් වී එහි රඳවා සිටින තැනැත්තන්ගේ රඳවා ගෙන සිටීමේ කොන්දේසි දැන ගැනීම පිණිස අවශ්‍ය වන පරීක්ෂා කිරීම් සිදු කළ හැකිය. |
| මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳව විමර්ශනයකදී අනාවරණය වීම සහ නොවීම මත වූ අවස්ථාවක කොමිසමේ කාර්යය පටිපාටිය | මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීම පිළිබඳව විමර්ශනයකින් පසුව මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීම පිළිබඳව,<br>➢ අනාවරණය නොවන අවස්ථාවකදී එම කරුණු වාර්තාගත කර දින තිහක් (30) ඇතුළත පැමිණිලිකරු වෙත දැනුම්දිය යුතු වේ.<br>➢ අනාවරණය වන අවස්ථාවකදී උචිත පරිදි එම කාරණය සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම සඳහා යොමු කළ හැකිය.<br><br>නමුත් එම කාරණය,<br>▪ සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම සඳහා යොමු කිරීම උචිත නොවන බව පෙනී යන අවස්ථාවකදී;<br>▪ එම කාරණය සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම උචිත බව කොමිෂන් සභාවට පෙනී යන නමුත් පාර්ශවකරුවන් සියල්ලම හෝ පාර්ශවකරුවන් අතුරින් යම් පාර්ශවකරුවෙකු විසින් සමගි කිරීමට හෝ සමථයකට පත් කිරීමට විරුද්ධ වන අවස්ථාවකදී;<br>▪ සමගි කිරීමට හෝ සමථයකට පත් කිරීමට ගත් උත්සහාය අසාර්ථක වූ අවස්ථාවකදී;<br><br>එම මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරන තැනැත්තාට හෝ තැනැත්තන්ට විරුද්ධව නඩු පවරන ලෙසට හෝ වෙනත් නඩු කටයුතු පවරන ලෙසට උචිත බලධරයන්ට නිර්දේශ කරනු ලැබිය හැකිය. |

6. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

| | |
|---|---|
| | ➢ එම උල්ලංඝනය කිරීම හෝ එම උල්ලංඝනය කිරීම් දිගටම පැවතීම වැළැක්වීමේ හෝ ඊට ප්‍රතිකර්ම යෙදීමේ අදහසින් උචිත බලධරයා වෙත හෝ අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වෙත කොමිෂන් සභාව සුදුසු යැයි කල්පනා කරන යම් නිර්දේශ කරනු ලැබිය හැකිය.<br><br>තවද, කොමිෂන් සභාව විසින්,<br><br>මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න වීමට උද්ගත වන;<br><br>➢ අදාළ ක්‍රියාව හෝ නොකර හැරීම නැවත සලකා බලන ලෙසට හෝ නිවැරදි කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.<br>➢ අදාළ තීරණය නැවත සලකා බලන ලෙසට හෝ නිවැරදි කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.<br>➢ අදාළ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීමට පදනම් වූයේ යම් පිළිවෙතක් මතද එම පිළිවෙත වෙනස් කරන ලෙසට නිර්දේශ කරනු ලැබිය හැකිය.<br>➢ අදාළ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීමට හේතු දැක්විය යුතු බවට නිර්දේශ කරනු ලැබිය හැකිය.<br><br>මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්න බවට වූ චෝදනාවකදී චෝදිත තැනැත්තාට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දිය යුතුය. එසේ නොමැතිව කොමිෂන් සභාව විසින් නිර්දේශයන් කරනු නොලැබිය යුතුය.<br><br>කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශයක පිටපතක් පැමිණිලිකරු අදාළ ආයතනයේ ප්‍රධානියාට සහ අදාළ ආයතනය භාරව සිටින අමාත්‍යවරයාට යොමු කළ යුතුය.<br><br>නිර්දේශයක් යොමු කරන ලද ආයතනයට හෝ තැනැත්තන්ට එම නිර්දේශයේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත එම නිර්දේශ බලාත්මක කිරීම පිණිස අදාළ ආයතනය හෝ තැනැත්තා විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ගය සම්බන්ධව කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසට නියම කළ හැකිය.<br><br>එම කාලසීමාව ඇතුළත කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පැහැර ඇති අවස්ථාවක හෝ එම ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාවේ මතය වූ විට එම කරුණ පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>ජනාධිපතිවරයා එම වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබීමට සැලැස්විය යුතුය. |
| සමගි කිරීමේ හෝ සමථයකට පත් කිරීමේ කාර්යය පටිපාටිය | පාර්ශවකරුවන් අතර සමගි කිරීම හෝ සමථයකට පත් කිරීම පිණිස එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් කිහිපදෙනෙකු කොමිෂන් සභාව විසින් පත් කළ හැකිය.<br><br>එම සමගිකරුවන් හෝ සමථකරුවන් ඉදිරියෙහි පෙනී සිටින ලෙසට පාර්ශවකරුවන්ට විධාන කළ හැකිය. |

| | |
|---|---|
| | එම රැස්වීම් රහසිගතව පැවැත්විය හැකිය.<br><br>සමගි කිරීම හෝ සමථ කිරීම සාර්ථක නොවූවිට හෝ පාර්ශවකරුවෙකු සමගි කිරීමට හෝ සමථ කිරීමට විරුද්ධ වූ අවස්ථාවකදී ඒ බව සමගිකරුවා හෝ සමථකරුවා කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.<br><br>සමගි කිරීම හෝ සමථ කිරීම සාර්ථක වූ විට එළඹුන නිරවුල් කිරීම පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.<br><br>සමගි කිරීම හෝ සමථ කිරීම සඳහා යොමු කරනු ලැබ නිරවුල් කිරීමකට එළඹ ඇති අවස්ථාවකදී එම නිරවුල් කිරීම බලාත්මක කිරීම පිණිස අවශ්‍ය විය හැකි විධාන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතුය. |
| විභාග කිරීම හෝ විමර්ශනය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව සතු බලතල | ලබා ගැනීමට අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම.<br><br>ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි සියලු තැනැත්තන් ගෙන් සාක්ෂිකරුවන් වශයෙන් ප්‍රශ්න කිරීම.<br><br>දිවුරුම හෝ ප්‍රතිඥා මත යම් සාක්ෂිකරුවෙකුට සාක්ෂි දෙන ලෙසට නියම කිරීම.<br><br>ශ්‍රී ලංකාව තුළ පදිංචිව සිටින යම් තැනැත්තෙකු සාක්ෂි දීම පිණිස හෝ තම සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම පිණිස කොමිෂන් සභාව වෙත කැඳවීම.<br><br>සාක්ෂිකරුවෙකු ලෙස එම තැනැත්තන්ගෙන් විභාග කිරීම හෝ ඔවුන් සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙසට නියම කිරීම.<br><br>විභාගයකට හෝ විමර්ශනයට මහජනයාට ඇතුළුවීමට ඉඩදීම හෝ එසේ ඉඩ නොදීම. |

# 04 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය

මානව හිමිකම් යනු මිනිසෙකු වී ඉපදීම නිසාවෙන් සෑම මනුෂ්‍යයෙකුටම හිමිවන ඔවුන්ගෙන් බෙදා වෙන් කළ නොහැකි අයිතිවාසිකම් සමූහයකි. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ලෙස වෙනම පරිච්ඡේදයක් ඇතුළත් කරමින් සහ ඉහත දැක්වෙන පරිදි මානව හිමිකම් කොමිෂන් සභාවක් ස්ථාපනය කර තිබීමම ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් සඳහා ලබාදී ඇති ප්‍රමුඛතාවය හඳුනා ගැනීමෙහි ලා ඉතා වැදගත් වේ. කෙසේ වෙතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ ඊටම අනන්‍ය වූ පනතකින් බලගැන්වෙන මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසා බැලීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය කාර්යය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සාධනීය පියවර රාශියක් ගෙන ඇති බව අනාවරණය විය. කොමිෂන් සභාව ඉදිරිපත් වන පැමිණිලි එහි විෂය පථයට අදාළදැයි පරීක්ෂා කරන ක්‍රමවේදය ඒ අතුරින් එකකි. කොමිෂන් සභාව වෙත ලැබෙන අධික පැමිණිලි සංඛ්‍යාවෙන් වැඩි කොටසක් එහි විෂය පථයට අදාළ ඒවා නොවූයෙන් ඒ වෙනුවෙන් කැප කරන කාලය පිළිබඳ ගැටලුවක් පැන නැගුනද මේ වන විට පැමිණිලි යොමුවන මුල් අවස්ථාවේදී ම ඒවායේ අදාළත්වය හඳුනාගැනීමෙන් මෙම ගැටලු මගහරවා ගැනීමට හැකියාවක් ලැබී ඇත.

තවද කොමිෂන් සභාව පිළිබඳ හඳුනා ගැනුණ තවත් සාධනීය කරුණක් ලෙස බිම් මට්ටමේ සිටින ජනතාවගේ මානව හිමිකම් සම්බන්ධ ගැටලු පිළිබඳව කටයුතු කිරීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කර ඇති යාන්ත්‍රණය ඉතාමත් ප්‍රගතිශීලී මට්ටමක පැවතීම හඳුන්වා දිය හැකිය. සිය ප්‍රාදේශීය කාර්යාල හරහා අදාළ ප්‍රදේශවල සිවිල් සමාජ සංවිධාන කව පිහිටුවා තිබීම මීට කදිම නිදසුනකි.

එමෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ව සමාජ විවේචන ද ඇත. ඇතැම් අවස්ථාවලදී මානව හිමිකම් විෂයය පිළිබඳ නිසි පරිචයක් නොමැති අය කොමිෂන් සභාවට කොමසාරිස්වරුන් ලෙස පත් වූ බවට විවේචනයක් තිබුණි. මීට අමතරව කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කරවීමට අදාළ නීතිමය ප්‍රතිපාදන නොමැති වීම ප්‍රධාන වශයෙන්ම මතු වූ විවේචනයකි. මේ නිසාවෙන් මහජනතාව අතර ගොඩ නැඟී ඇති එක් මතයක් වන්නේ කොමිෂන් සභාවට තම ගැටලු ඉදිරිපත් කිරීම ඵල රහිත බවයි.[7]

එපමණක් නොව ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය (GANHRI) විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ සමාලෝචනයන් සිදු කරමින් සිදු කළ ශ්‍රේණිගත කිරීමට අනුව 2021 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහතට වැටී ඇත. GANHRI විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත හෙලූ දෙවන අවස්ථාව මෙයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය සහ 20 වැනි සංශෝධනය යන දෙකම මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය ඛාදනය කළේය. එහි ස්වාධීනත්වය යළි ස්ථාපිත කළේ 19 වැනි සංශෝධනයයි.

GANHRI ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව A ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පහත හෙලීමට ඔවුන් විසින් නිකුත් කළ වාර්තාවේ ප්‍රධාන හේතු ලෙස පැරිස් මූලධර්මවල අවශ්‍යතාවලට අනුකූලව ආයතනයේ ස්වාධීනත්වය සහ ඵලදායිතාවය ප්‍රමාණවත් ලෙස පවත්වා ගෙන ගොස් නොමැති බවත්, අත්අඩංගුවේ/ බන්ධනාගාරගතව සිටියදී මරණ සහ වධහිංසා පැමිණවීම් ඇතුළු සියලුම මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඵලදායී ලෙස සම්බන්ධ වී ප්‍රසිද්ධියේ ආමන්ත්‍රණය කර නොමැති

7. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL.

බවත්, සියලු මානව හිමිකම් ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන ආකාරයෙන් කතා කර නොමැති බවත් සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට සමාන්තර වාර්තාවක් ඉදිරිපත් නොකළ බවත් ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානයේ ප්‍රතීතනනය පිළිබඳ උප කාරක සභාව සඳහන් කර සිටියි.[8]

පසුගිය සමය තුළ ශ්‍රී ලංකාවේ සිදු වූ මානව හිමිකම් කඩවීම් සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සහ මැදිහත්වීම පිළිබඳව මාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර මහතා දැක්වූ යේ මෙවැනි අදහසකි.

මාධ්‍යවේදීන් සහ සමාජ ක්‍රියාකාරීන් හැටියට පසුගිය අරගල සමය තුළදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත නිරන්තරයෙන් යෑමට සිදු විය. ඒ පැමිණිලි කිරීමට, තොරතුරු ලබා දීමට සහ ඉල්ලීම් කිරීම සඳහා ය. ඒ වාගේම අප මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම අපේක්ෂා කළ අතර අරගල කාල සීමාව තුළදී  නිරීක්ෂණ සඳහා පැමිණෙන ලෙසට කොමිෂන් සභාවට ආරාධනා කළ විට නිලධාරීන් එම ස්ථානයන්වලට පැමිණ සිටියේය. මීට අමතරව මානව හිමිකම් කඩ වූ තවත් සිදුවීම් පිළිබඳව විමර්ශන කරන ලෙස ඉල්ලා සිටියදී ඔවුන් එම සිදුවීම් විමර්ශනය කිරීම සඳහා පියවර ගෙන තිබුණි. නිදසුන් වශයෙන් පසුගිය වසරේ මාර්තු 31 දා මිරිහානේදී  සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් විමර්ශනයක් ඉල්ලා සිටි අතර මෑතක් වන තුරු එම විමර්ශනය කැඳවමින් තිබුණි. එමෙන්ම පසුගිය වසරේ අප්‍රේල් 19 දා රඹුක්කනදී  සිදු වූ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනය කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය අතර එම සිදුවීම නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව මඟින් වාර්තාවක් ද නිකුත් කෙරිණි.

මේ අයුරින් අවස්ථා ගණනාවකදී ම තරිඳු උඩුවරගෙදර මහතා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව කළ විමර්ශන, ඒ මත නිකුත් කරන ලද වාර්තා, කැඳවා ප්‍රශ්න කිරීම් සහ නිර්දේශ ලබා දීම් වැනි ගත් ක්‍රියාමාර්ග අත් දැකීමෙන් පසු කොමිෂන් සභාවේ ක්‍රියාත්මකවීම සහ මැදිහත්වීම පිළිබඳව ද ඉතා සෑහීමට පත් වූ බව ඒ මහතා පවසා සිටියි. මීට අමතරව පසුගිය කාල සමයේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කළ තවත් සාධනීය මැදිහත්වීමක් ලෙස දණ්ඩ නීති සංග්‍රහයේ සහ පොලිස් ආඥා පනතේ ඇතැම් නීති අවභාවිතා කර ඉකුත් දිනවල පැවති පා ගමන්වලට සිදු කළ පහරදීම් සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩු කිහිපයක් උපුටා දක්වා පොලිස්පතිවරයා වෙත ලිපියක් යොමු කිරීමට ගත් ක්‍රියාමාර්ගය සඳහන් කිරීමට හැකිවක් ඇත. නමුත් ඒ මහතා පවසා සිටින්නේ මානව හිමිකම් කොමිෂන් සභාව එසේ ක්‍රියාත්මක වූවද එම සිදු කරන මැදිහත්වීම් දේශපාලන තන්ත්‍රය විසින් අවතක්සේරු කර සිටින බවය. එලෙස කොමිෂන් සභාව විසින් මානව හිමිකම් කඩ වීම් සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග පොලිසිය සහ අනෙකුත් ආයතන නොතකා හැරීම මඟින් සිදුවන්නනේ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සහ ක්‍රියාකාරීත්වය සීමා වීමක් බව ඒ මහතාගේ අදහසයි. ඒ අනුව ඔහු සඳහන් කර සිටින්නේ මානව හිමිකම් කොමිෂන් සභාවට පවතිනවාට වඩා නීතිමය බලතල සංශෝධනයක් මඟින් ලැබිය යුතු බවය. තවද නීතිමය ප්‍රතිසංස්කරණ නොවුනද කොමිෂන් සභාව විසින් නිර්දේශයන් නිකුත් කළ විට එයට පිළිගැනීමක් අනෙකුත් ආයතන දැක්විය යුතු බවට ඔහු විශ්වාස කර සිටියි.

වර්තමානය වන විට මානව හිමිකම් කොමිෂන් සභාව පවතින්නේ අවතක්සේරුවට ලක් වූ කොමිෂන් සභාවක් ලෙසය. එබැවින් ඉදිරියේදී  ත්‍රස්ත පනත වැනි පනත් සම්මත වුවහොත් මහජනතාවගේ මානව අයිතිවාසිකම් කඩ වුවාට පසු ඒ සිදුවීම් පිළිබඳ විමර්ශනය කිරීමට කොමිෂන් සභාවට බලතල ලබා දීම විහිළුවක් බවත් හුදෙක් නිර්දේශ ලබාදී  වාර්තා පළ කරන අධ්‍යයන ආයතනයක් බවට මානව හිමිකම් කොමිෂන් සභාව පත් නොවිය යුතු බවත් ඒ මහතා ප්‍රකාශ කර සිටියි. තවදුරටත් ඔහු කියා සිටින්නේ මානව හිමිකම් කොමිෂන් සභාව සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමකට පත්වන නමුත් කොමිෂන් සභාවට අනෙකුත් ආයතන විසින් ලබාදෙන වටිනාකම සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන බවයි.

මානව හිමිකම් කොමිෂන් සභාව 2021 වර්ෂයේ සිට මේ වන තෙක්ම ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය විසින් පහත හෙලන ලද B ශ්‍රේණියේම පවති. වීම ශ්‍රේණියේම තව දුරටත් පැවතීමට හේතු සාධක ලෙස පෙනෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් එහි ස්වාධීනත්වයට සිදු වූ බලපෑම්

8. GANHRI Sub-Committee on Accreditation Report – October 2021. SCA reports - GANHRI

සහ පැරිස් මූලධර්මයන්ට අනුකූලව ස්වාධීනත්වය සහ ඵලදායිතාව අඩු වීම යන කාරණාවල තවමත් විශාල වෙනස් වීමක් සිදුව නොමැති වීමය. එපමණක් නොව කොමිෂන් සභාව කෙතරම් ස්වාධීනව සහ නිවැරදි නිර්දේශ ලබා දුන්න ද ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම ද දක්නට ලැබෙන තවත් අර්බුදයකි. දේශපාලන අධිකාරිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උත්සුක නොවීම මෙම අර්බුදය පැන නැගීමට ප්‍රධන හේතුවක් ලෙසින් ගෙනහැර දක්වන්නට පුළුවනි. ඒ අනුව ඉහත සාකච්ඡා කළ අඩුලුහුඬුකම් නිසාවෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය යම්තාක් දුරකට සීමා වී ඇත. එම සීමාවන් මගහැරවා ගැනීමට නම් මානව හිමිකම් කොමිෂන් සභාවේ පවතින බලතල නීතිමය සංශෝධනයක් හරහා පුළුල් කිරීම කාලීන අවශ්‍යතාවයකි. එපමණක් නොව මානව හිමිකම් කොමිෂන් සභාව කිසිඳු ආයතනයක් හෝ දේශපාලන අධිකාරියක් විසින් අවතක්සේරුවට ලක් නොකළ යුතුය. එසේ කිරීමෙන් කොමිෂන් සභාවට ලැබිය යුතු නිසි පිළිගැනීම ලැබෙන අතර ඒ හරහා මානව හිමිකම් කොමිෂන් සභාව කෙරෙහි ඇති විශ්වාසය සහ ස්වාධීනත්වය තහවුරු වේ.

# 05 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි සහ නිර්දේශ පිළිබඳ විශ්ලේෂණය

## 5.1 වර්ෂ 2021දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන්

| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය කිලිනොච්චිය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | මන්නාරම | පුත්තලම | | | |
| **පුද්ගලික නිදහස** | 17 | 112 | 21 | 51 | 109 | 51 | 93 | 155 | 39 | 56 | 25 | 84 | 813 | 803 | 1616 |
| (a) වධහිංසාව (ශාරීරික සහ මානසික) | 3 | 36 | 1 | 5 | 26 | 4 | 18 | 13 | 4 | 7 | 5 | 12 | 134 | 168 | 302 |
| (b) වෙනස්කොට සැළකීම | - | - | - | - | 6 | - | - | 2 | 1 | - | - | 3 | 12 | - | 12 |
| (c) අඩත්තේට්ටම් | 2 | 4 | 13 | 9 | 30 | 25 | 23 | - | 9 | 34 | 11 | 32 | 192 | 199 | 391 |
| (d) ලිංගික අඩත්තේට්ටම් | 1 | - | - | - | - | - | - | - | - | - | - | | 1 | 7 | 8 |
| (e) තර්ජනය | - | 7 | - | 10 | 23 | 3 | - | 34 | 2 | 1 | - | 18 | 98 | - | 98 |
| (f) අත්තනෝමතික සිරභාරයට ගැනීම්/ රඳවා තබා ගැනීම් | 12 | 65 | 7 | 27 | 24 | 19 | 51 | 99 | 23 | 14 | 9 | 19 | 369 | 403 | 772 |
| (g) අත්අඩංගුවේදී සිදුවන ඝාතනයන් | 2 | - | - | - | - | - | - | - | - | - | - | - | 2 | 11 | 13 |
| (h) නිසි අධිකරණ ක්‍රියාමාර්ගයෙන් බාහිරව සිදුවන ඝාතනයන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| (i) බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| (j) පුද්ගල අතුරුදහන්වීම්** | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| (k) සිරකරු අයිතිවාසිකම් | - | - | - | - | - | - | 1 | 4 | - | - | - | - | 5 | 15 | 20 |
| **වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්** | - | - | - | 4 | 2 | 2 | 2 | 2 | - | - | - | - | 12 | 3 | 15 |
| **රැකියා** | 17 | 48 | 38 | 24 | 30 | 34 | 120 | 51 | 8 | 17 | 3 | 34 | 424 | 387 | 811 |
| **අධ්‍යාපනය** | - | 3 | 7 | 25 | 9 | 13 | 52 | 60 | - | 1 | 1 | 11 | 182 | 135 | 317 |
| **සමාජ සුබසාධනය හා සේවා** | - | - | - | 3 | 16 | 8 | 15 | 4 | 4 | 1 | 3 | 4 | 58 | - | 58 |


| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| යටිතල පහසුකම් | 1 | - | 4 | - | 3 | 7 | 11 | 1 | - | 2 | - | 3 | 32 | 8 | 40 |
| ඡන්දහිමියන් හා සම්බන්ධ අයිතිවාසිකම් | - | - | - | 1 | - | 1 | - | - | - | - | - | 2 | 4 | 3 | 7 |
| රජයේ ආයතනයගේ නොකර හැරීම් | 27 | 208 | 73 | 247 | 98 | 55 | 143 | 35 | 23 | 53 | 14 | 4 | 980 | 100 | 1080 |
| (a) පොලීසිය | 5 | 60 | 39 | 165 | 72 | 44 | 68 | 25 | 14 | 32 | 10 | - | 534 | 58 | 592 |
| (b) වෙනත් රාජ්‍ය ආයතන | 22 | 148 | 34 | 82 | 26 | 11 | 75 | 10 | 9 | 21 | 4 | - | 442 | 42 | 484 |
| ළමා අයිතිවාසිකම් | - | 3 | - | 2 | - | 3 | 2 | - | - | - | - | - | 10 | - | 10 |
| ආබාධිත තැනැත්තන් සඳහා වූ අයිතිවාසිකම් | - | - | - | - | - | - | 1 | - | - | - | - | - | 1 | 2 | 3 |
| භාෂා අයිතිවාසිකම් | - | - | - | - | - | - | 1 | - | - | - | - | 1 | 2 | - | 2 |
| විදෙස්ගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් | - | 2 | - | 6 | - | - | 1 | - | 1 | - | - | 1 | 11 | 3 | 14 |
| LGBT අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 4 | 4 |
| සෞඛ්‍ය අයිතිවාසිකම් | - | 2 | 1 | 6 | 2 | - | 1 | - | - | - | - | - | 12 | 4 | 16 |
| ඉඩම් හා දේපළ අයිතිවාසිකම් | 20 | 22 | 15 | 19 | 16 | 19 | 32 | 11 | 10 | 26 | 16 | 45 | 251 | 66 | 317 |
| සංක්‍රමණික/ සරණාගත | - | - | - | - | 1 | - | 1 | - | - | - | - | - | 1 | - | 1 |
| පාරිසරික අයිතිවාසිකම් | - | 1 | - | 2 | 3 | 1 | 5 | 3 | - | 1 | 1 | 4 | 15 | 9 | 24 |
| පරිපාලනමය විෂමතා | 3 | - | 10 | - | 7 | 8 | 34 | 16 | 7 | 1 | - | 17 | 103 | 71 | 174 |
| කාන්තා අයිතිවාසිකම් | - | - | - | - | - | - | - | 1 | - | 1 | - | | 2 | - | 2 |
| වෙනත් (විෂය පථයට අයත් නොවන, වෙනත් ආයතන වෙත යොමු කළ) | 50 | 75 | 22 | 10 | 16 | 5 | 23 | 95 | 3 | 9 | 7 | - | 315 | 1496 | 1811 |
| එකතුව | 135 | 476 | 191 | 400 | 311 | 207 | 532 | 434 | 95 | 168 | 69 | 210 | 3228 | 3094 | 6322 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් පිටුවෙන්[9]

9. https://www.hrcsl.lk/reports/statistics-of-complaints/?lang=si


ඉහත දැක්වෙන්නේ 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයට ලැබුණු පැමිණිලි ඇතුළත් වගුව වන අතර ඒ අනුව ප්‍රතිශතයක් ලෙස ගත් විට පැමිණිලි ලැබී ඇත්තේ මෙසේ ය.

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාලවලට ලැබුණු පැමිණිලි




ඉහත දැක්වෙන දත්තයන් සලකා බැලීමේදී පෙනී යන්නේ ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් ප්‍රාදේශීය සංඛ්‍යාවෙන් ප්‍රධාන කාර්යාලයට 49%ක් (3094) ද, අම්පාර ප්‍රාදේශීය කාර්යාලයට 2%ක් (135) ද, අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයට 7.5%ක් (476) ද, බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (191) ද, මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයට 6%ක් (400) ද, යාපනය සහ කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලයට 5%ක් (311) ද, කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (207) ද,මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට 8.5%ක් (532) ද, මාතර ප්‍රාදේශීය කාර්යාලයට 7%ක් (434) ද, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයට 2%ක් (95) ද, වව්නියාව ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (168) ද, මන්නරම් ප්‍රාදේශීය කාර්යාලයට 1%ක් (69) ද, සහ පුත්තලම් ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (210) ද වශයෙන් පැමිණිලි යොමු කොට ඇත.

2021 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලද පැමිණිලිවල ස්වභාවය



මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ පුද්ගලික නිදහස සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 25.56%ක් (1616) වේ. පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ලැබී ඇත්තේ අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳවය. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 12.21%ක (772) ප්‍රමාණයකි. අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය (403) වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (99) වාර්තා වන්නේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය. දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ අඩත්තේට්ටම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 6.1% (391) කි. ඒ සම්බන්ධයෙන් ද වැඩිම පැමිණිලි ප්‍රමාණයක් වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය (199) වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (34) වාර්තා වන්නේ වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ රාජ්‍ය ආයතනයන් තුළින් සිදුවන සේවා පැහැර හැරීම්, නොකර හැරීම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 17%කි (1080). දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ රැකියා සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනය වීම් (811) පිළිබඳවය.

ළමා හා කාන්තා අයිතිවාසිකම්, භාෂා අයිතිවාසිකම්, ආබාධිත තැනැත්තන් සඳහා වූ අයිතිවාසිකම්, සංක්‍රමණික/ සරණාගත සහ LGBT අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව පැමිණිලි ලැබී ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි.

කෙසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට නොගැනෙන හා වෙනත් ආයතනවලට යොමුකරන ලද පැමිණිලි සංඛ්‍යාව සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 28.64%ක (1811) ප්‍රමාණයකි. එම පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ප්‍රධාන කාර්යාලය (1496) වෙත ලැබී ඇති අතර, දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මාතර ප්‍රාදේශීය කාර්යාලය (95) වෙතටය.

සමස්තයක් වශයෙන්, 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලය (532) වෙතටය. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (69) ලැබී ඇත්තේ මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.

## 5.2 වර්ෂ 2022 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිලි, එහි වර්ගීකරණය සහ පැමිණිලි ලද ප්‍රදේශයන්


| පැමිණිලි වර්ගය | ප්‍රාදේශීය කාර්යාල | | | | | | | | | | | | | ප්‍රාදේශීය කාර්යාල | ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අම්පාර | අනුරාධපුරය | බදුල්ල | මඩකලපුව | යාපනය | කිලිනොච්චිය | කල්මුණේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | මන්නාරම | පුත්තලම | | | |
| **පුද්ගලික නිදහස** | 42 | 128 | 23 | 31 | 94 | 19 | 31 | 120 | 185 | 34 | 30 | 15 | 53 | 805 | 1423 | 2228 |
| (a) වධහිංසාව (ශාරීරික සහ මානසික) | 5 | 41 | 1 | 1 | 24 | 3 | 1 | 19 | 15 | 1 | 16 | 6 | 8 | 141 | 419 | 560 |
| (b) වෙනස්කොට සැළකීම | | | | 1 | 3 | 2 | 1 | | 8 | | | | | 15 | 1 | 16 |
| (c) අඩත්තේට්ටම් | | 4 | 11 | 6 | 27 | 6 | 10 | 45 | | 26 | 7 | 6 | 1 | 149 | 439 | 588 |
| (d) ලිංගික අඩත්තේට්ටම් | | | | | | | | | | | | | | | 8 | 8 |
| (e) තර්ජනය | 2 | 7 | | 2 | 15 | 2 | 3 | 6 | 35 | | | | | 72 | | 72 |
| (f) අත්තනෝමතික සිරභාරයට ගැනීම්/ රඳවා තබා ගැනීම් | 35 | 76 | 10 | 21 | 22 | 6 | 16 | 43 | 111 | 7 | 7 | 3 | 44 | 401 | 518 | 919 |
| (g) අත්අඩංගුවේදී සිදුවන ඝාතනයන් | | | 1 | | | | | 2 | 2 | | | | | 5 | 8 | 13 |
| (h) නිසි අධිකරණ ක්‍රියාමාර්ගයෙන් බාහිරව සිදුවන ඝාතනයන් | | | | | | | | | 4 | | | | | 4 | 20 | 24 |
| (i) පුද්ගල අතුරුදහන්වීම් | | | | | 1 | | | 1 | 1 | | | | | 3 | 2 | 5 |
| (j) සිරකරු අයිතිවාසිකම් | | | | | 2 | | | 4 | 9 | | | | | 15 | 8 | 23 |
| **වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්** | | 1 | | 36 | | 1 | 6 | 6 | 1 | 2 | | | | 53 | 24 | 77 |
| **රැකියා** | 26 | 80 | 92 | 52 | 43 | 3 | 45 | 173 | 120 | 26 | 16 | 9 | 38 | 723 | 1007 | 1730 |
| **අධ්‍යාපනය** | 4 | 6 | 12 | 15 | 13 | 6 | 57 | 53 | 59 | 7 | 2 | | 3 | 237 | 204 | 441 |
| **සමාජ සුබසාධනය හා සේවා** | 1 | 9 | 1 | 3 | 8 | 2 | 5 | 12 | 13 | 4 | 4 | 2 | | 64 | 11 | 75 |
| **යටිතල පහසුකම්** | 2 | | 6 | | 5 | 2 | 3 | 10 | 8 | | 1 | | | 37 | 72 | 109 |
| **ඡන්දහිමියන් හා සම්බන්ධ අයිතිවාසිකම්** | | | | | | | 1 | 3 | | | | | 2 | 6 | 7 | 13 |
| **රජයේ ආයතනයගේ නොකර හැරීම්** | | 294 | | | | | | | | | | | | | | 2157 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (a) පොලීසිය | 16 | | 41 | 185 | 62 | 17 | 48 | 82 | 49 | 31 | 29 | 4 | 20 | 584 | 683 | 1267 |
| (b) වෙනත් රාජ්‍ය ආයතන | 42 | | 11 | 105 | 22 | 2 | 20 | 138 | 40 | 14 | 18 | 4 | 17 | 433 | 163 | 596 |
| **ළමා අයිතිවාසිකම්** | | | | 1 | 4 | | 2 | | 1 | 1 | 1 | | | 10 | 1 | 11 |
| **වැඩිහිටි අයිතිවාසිකම්** | | | | | | | | | | | | | | | 2 | 2 |
| **ආබාධිත තැනැත්තන් සඳහා වූ අයිතිවාසිකම්** | | | | | | | 1 | 1 | 1 | | | | | 3 | 12 | 15 |
| **භාෂා අයිතිවාසිකම්** | | | | | | 1 | | 2 | | 2 | 1 | 1 | 1 | 8 | 10 | 18 |
| **විදෙස්ගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම්** | | 2 | 2 | 4 | | | | | | 3 | | | | 11 | 3 | 14 |
| **LGBT අයිතිවාසිකම්** | | | | 1 | 1 | | | 3 | 3 | | | | | 8 | 62 | 70 |
| **සෞඛ්‍ය අයිතිවාසිකම්** | | | | | 3 | | 1 | 1 | | | | | | 5 | 9 | 14 |
| **ඉඩම් හා දේපළ අයිතිවාසිකම්** | 23 | 65 | 45 | 9 | 7 | 11 | 16 | 42 | 31 | 16 | 18 | 10 | 23 | 316 | 267 | 583 |
| **සංක්‍රමණික/ සරණාගත** | | | | | | | | | | | | | | | 3 | 3 |
| **පාරිසරික අයිතිවාසිකම්** | | 5 | | | | 1 | 3 | 5 | 9 | 1 | | 1 | | 25 | 15 | 40 |
| **පරිපාලනමය විෂමතා** | | | 21 | | 4 | | | 99 | 48 | 7 | 1 | | 11 | 191 | 180 | 371 |
| **කාන්තා අයිතිවාසිකම්** | | | | | | | 1 | 1 | 2 | | | | | 4 | 2 | 6 |
| **වෙනත් (විෂය පථයට අයත් නොවන, වෙනත් ආයතන වෙත යොමු කළ)** | | 38 | 32 | 11 | 5 | 4 | 1 | 61 | 111 | 8 | 6 | 1 | | 278 | 1246 | 1524 |
| **වෙනත් ආයතන වෙත යොමු කිරීම** | | | | | | | | | 12 | | | | | 12 | | 12 |
| **එකතුව** | 156 | 628 | 286 | 453 | 271 | 69 | 241 | 812 | 693 | 156 | 127 | 47 | 168 | 3813 | 5406 | 9219 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වෙබ් පිටුවෙන්[10]


10. https://www.hrcsl.lk/reports/statistics-of-complaints/?lang=si

2022 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන
කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට ලැබුණු පැමිණිලි




ඉහත දැක්වෙන දත්තයන් සලකා බැලීමේදී පෙනී යන්නේ ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් ප්‍රාදේශීය සංඛ්‍යාවෙන් ප්‍රධාන කාර්යාලයට 57%ක් (5406) ද, අම්පාර ප්‍රාදේශීය කාර්යාලයට 2%ක් (156) ද, අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයට 7%ක් (628) ද, බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (286) ද, මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයට 5%ක් (453) ද, යාපනය ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (271) ද, කිලිනොච්චිය ප්‍රාදේශීය කාර්යාලයට 1%ක් (69) ද, කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලයට 3%ක් (241) ද, මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට 8%ක් (812) ද, මාතර ප්‍රාදේශීය කාර්යාලයට 7%ක් (693) ද, ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයට 2%ක් (156) ද, වව්නියාව ප්‍රාදේශීය කාර්යාලයට 1%ක් (127) ද, මන්නරම් ප්‍රාදේශීය කාර්යාලයට 0.5%ක් (47) ද, සහ පුත්තලම් ප්‍රාදේශීය කාර්යාලයට 2%ක් (168) ද වශයෙන් පැමිණිලි යොමු කොට ඇත.

2022 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට
ලද පැමිණිලිවල ස්වභාවය



වර්ෂ 2022දී මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ පුද්ගලික නිදහස සම්බන්ධයෙනි. එම ප්‍රමාණය (2228) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 24.16%ක් වේ. පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ලැබී ඇත්තේ අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් පිළිබඳවය. එම ප්‍රමාණය (919) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 9.9%ක ප්‍රමාණයකි. අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (518) වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (111) වාර්තා වන්නේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය. දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ අඩත්තේට්ටම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය (588) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 6.37% කි. ඒ සම්බන්ධයෙන්ද වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (439) වාර්තා වන්නේ ප්‍රධාන කාර්යාලය වෙතටය. ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් (45) වාර්තා වන්නේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.


අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳ පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (2157) ලැබී ඇත්තේ රාජ්‍ය ආයතනයන් තුළින් සිදුවන සේවා පැහැර හැරීම්, නොකර හැරීම් සම්බන්ධයෙනි. එම ප්‍රමාණය සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 23.39%කි. භාෂා අයිතිවාසිකම්, සංක්‍රමණික/ සරණාගත, කාන්තා අයිතිවාසිකම් සහ LGBT අයිතිවාසිකම් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව පැමිණිලි ලැබී ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි.

කෙසේ වුවද, මානව හිමිකම් කොමිෂන් සභාවේ විෂය පථයට නොගැනෙන හා වෙනත් ආයතනවලට යොමුකරන ලද පැමිණිලි සංඛ්‍යාව (1524) සමස්ථ පැමිණිලි සංඛ්‍යාවෙන් 16.5%ක ප්‍රමාණයකි. එම පැමිණිලි අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (1246) ප්‍රධාන කාර්යාලය වෙත ලැබී ඇති අතර, දෙවනුවට වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (111) ලැබී ඇත්තේ මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය.


ප්‍රාදේශීය කාර්යාල අතුරින් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (812) ලැබී ඇත්තේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලය වෙතටය. අඩුම පැමිණිලි සංඛ්‍යාවක් (47) ලැබී ඇත්තේ මන්නාරම ප්‍රාදේශීය කාර්යාලය වෙතට ය.

මෙම කාල සීමාව තුළදී ද අපගේ රට පුර විසිරී ඇති මානව හිමිකම් මධ්‍යස්ථානයන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ කර්යය භාරය සහ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කරමින්, මහජනතාව මුහුණ දෙන නොයෙකුත් මානව හිමිකම් කඩවීම්වලට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට සෑම ප්‍රදේශයකම පාහේ මූලිකව කටයුතු කර ඇත.


## 5.3 2022 මැයි මස සිට 2023 අප්‍රේල් මස දක්වා මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කළ පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය




ඉහත ප්‍රස්තාරයේ දක්වා ඇති තහවුරු කර ගත් දත්තයන්ට අනුව සලකා බැලීමේදී දිස්ත්‍රික්ක 08ක් අතුරින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි රාශියක් අතුරින් ප්‍රධාන පැමිණිලි 50ක් හඳුනාගත හැකිවිය.




ඒවා විශ්ලේෂණය කිරීමේදී සමස්ථ දිස්ත්‍රික්ක අතුරින් සාපේක්ෂ වශයෙන් ප්‍රතිශතයක් ලෙස ගත් විට ගම්පහ දිස්ත්‍රික්කයෙන් 16%ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 32%ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයෙන් 12%ක් ද, පුත්තලම දිස්ත්‍රික්කයෙන් 08%ක් ද, මාතර දිස්ත්‍රික්කයෙන් 12%ක් ද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් 12%ක් ද කළුතර 4% ක් ද සහ කොළඹ 4%ක් ද වශයෙන් රජයේ විධායක සහ පරිපාලන ආයතන මගින් මහජනතාවට සිදු වූ අකටයුතුකම් පිළිබඳ පැමිණිලි මානව හිමිකම් කොමිසම වෙත යොමු කොට තිබේ.




මෙම පැමිණිලිවලට අදාළ පැමිණිලිකරුවන් පිළිබඳව පරීක්ෂා කිරීමේදී ඉන් 62%ක ප්‍රමාණයක් පුරුෂයින් බවත් 38%ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් වන බව ද නිරීක්ෂණය වේ.




මෙම පැමිණිලිවලට අදාළ වග උත්තරකාර රාජ්‍ය ආයතන සහ රජයේ නිලධාරින් පිළිබඳව පරීක්ෂා කිරීමේදී ඉන් 60%ක ප්‍රමාණයක් ප්‍රධාන වශයෙන් පොලිස් නිළධාරීන්ගෙන් හා අනෙකුත් ආරක්ෂක අංශයන්ගෙන් සිදු වූ අසාධාරණයන්ට එරෙහිව ඔවුන් වග උත්තරකරුවන් ලෙස නම් කරමින් සිදු කරන ලද පැමිණිලි බව නිරීක්ෂණය වන අතර වෙනත් රාජ්‍ය ආයතන හෝ නිලධාරින් සම්බන්ධයෙන් පවතින්නේ 40%ක ප්‍රතිශතයක් බව නිරීක්ෂණය වන කරුණකි.

මෙම පැමිණිලි තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී ප්‍රධාන කාණ්ඩ 04ක් යටතේ සිදු කොට ඇති බව නිරීක්ෂණය වේ. එනම්,

1) වධහිංසා සිදුකිරීම්


2) අත්තනෝමතිකව අත්අඩංගුවට ගැනීම්

3) නීතිවිරෝධී රඳවා තබා ගැනීම්

4) පරිපාලන විෂමතා

ඒ අනුව තවදුරටත් ඒ සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේදී පරිපාලන විෂමතා 68%ක් ද, වධහිංසා සිදු කිරීම් 14%ක් ද, අත්තනෝමතිකව අත් අඩංගුවට ගැනීම් 10%ක් ද, නීතිවිරෝධී රඳවා තබා ගැනීම් 08%ක් ද සහ වශයෙන් පවතින බව නිරීක්ෂණය වේ.

පැමිණිලි සිදු කර ඇති ක්ෂේත්‍රයන්




මෙහිදී සාපේක්ෂව ගත් කළ වැඩිම ප්‍රතිශතයක් එනම් 68%ක් පරිපාලන විෂමතා සම්බන්ධයෙන් පවතින හෙයින් ඊට අදාළ වග උත්තරකාර රාජ්‍ය ආයතන පිළිබඳව පරික්ෂා කිරීමේදී පෙනී යන්නේ ඉන් 50%ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පවතින කාරණා බවයි. අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් පවතින්නේ 50%ක ප්‍රතිශතයක් බව නිරීක්ෂණය වේ.

පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම මගින් විමසීම් පවත්වා තිබේදැයි වින්දිතයින්ගෙන් ලද තොරතුරු අනුව පරික්ෂා කිරීමේදී පෙනී යන්නේ 34%ක ප්‍රමාණයක් සම්බන්ධයෙන් විමර්ශනය සිදු කරමින් පවතින බව හෝ කොමිසමේ අවධානය මේ සම්බන්ධයෙන් යොමුවී ඇති බව දන්වා තිබෙන බවයි. එසේම 24%ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සඳහා කැඳවා තිබේ. තවත් 4%ක ප්‍රතිශතයක් සම්බන්ධයෙන් එම පැමිණිලි ඔවුන්ට අදාළ නොවන බව දන්වා තිබේ. එසේම තවත් 1% සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර ඇති බව දන්වා තිබේ. තවත් 1% ප්‍රතිශතයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු පැවතීම හේතුවෙන් ඉදිරියට මේ සම්බන්ධයෙන් මැදිහත් වීමක් සිදු කර නොහැකි බව දන්වා තිබේ. මෙම පැමිණිලිවලින් 4%ක ප්‍රතිශතයක වින්දිතයින් තම පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කිරීමක් සිදු නොකරන බවත් එනම් ඔවුන්ගේ ප්‍රතිචාරයක් නොමැති බවත් නිරීක්ෂණය වේ. මෙහිදී පෙනී යන්නේ තවත් 32% පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරියේදී කටයුතු කිරීමට ඉතිරිව ඇති බවයි.

මෙම සමස්ථ පැමිණිලිවලින් කොමිසම මගින් කොපමණ ප්‍රමාණයකට නිර්දේශ ලබාදී ඇති බව හෝ මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම හේතුවෙන් ගැටලු විසඳී ඇත් දැයි පරික්ෂා කිරීමේදී සමස්ථ පැමිණිලිවලින් 14%ක ප්‍රමාණයකට නිර්දේශ ලබාදී හෝ ගැටලු විසඳී ඇති බව නිරීක්ෂණය වේ. තවත් පැමිණිලි 10%ක් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් ඉදිරියට මැදිහත්වීමක් සිදු නොකරන බව හෝ ශ්‍රේෂ්ඨාධිකරණ මේ සම්බන්ධව නඩුවක් ඇති බැවින් බහා තැබීමක් හෝ සමහරක් පැමිණිලි ඔවුන්ට අදාළ

නොවන බව හෝ තවදුරටත් වින්දිතයන්ගේ සහභාගිත්වයක් නොමැතිබව ඉහතදී පෙනී ගිය කරුණකි. කෙසේ වුවද සමස්ථ පැමිණිලිවලින් 76%ක ප්‍රමාණයකට කොමිෂන් සභාව තම නිර්දේශ ලබා දිය යුතුව තිබෙන බව ඉහත පැමිණිලි සියල්ල විශ්ලේෂණයේදී නිරීක්ෂණය වේ.

මෙම විශ්ලේෂණයට භාජනය කළ ඉහත පැමිණිලි සියල්ලම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම පිළිබඳව පරීක්ෂා කිරීමේදී දින තහවුරු කරගත හැකි වූයේ පැමිණිලි 38ක පමණි. එම පැමිණිලි 38න් කොමිෂන් සභාව තමන් වෙත ලැබුණු පැමිණිලිවලින් 63%ට ආසන්න ප්‍රමාණයකට පැමිණිල්ල ලැබී මාසයක් ඇතුළත ප්‍රතිචාර දක්වා ඇති අතර ඒ අනුව ඊට අදාළ වින්දිතයින් වෙත ලියාපදිංචි පැමිණිලි අංකය තැපැල් මගින් ලැබෙන්නට සලස්වා තිබෙන බව නිරීක්ෂණය වේ. මෙය සාධනීය තත්ත්වයක් ලෙස නිගමනය කළ හැකිය. එම පැමිණිලිවලින් 37%ක ප්‍රමාණයක් සඳහා මාසයක් ප්‍රතිචාර නොදක්වා ඇති බව පෙනී යයි. එනම් ලියාපදිංචි දිනයන් මසක් ඇතුළත ලැබී නොමැති බව පෙනී යයි.

# නිගමන හා නිර්දේශ

ලංකාවේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන අතර ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ. මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීම ශ්‍රී ලංකාවේ ඉදිරිගාමී තීරණයක් ලෙස නිගමනය කළ හැකිය. මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ සෑම කටයුත්තක් කෙරෙහි බල පැවැත්වෙන්නා වූ කාරණයකි. දියුණු වෙමින් පවතින තෙවෙනි ලෝකයේ රටක් ලෙස ලංකාවට හිමි වන GSP+, IMF වැනි සහන ලබා දීම තීරණය කරන්නා වූ එක් තීරණාත්මක සාධකයක් ලෙස මෙම මානව හිමිකම් කටයුතු කරයි. එනිසාම මානව හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ කේන්ද්‍රස්ථානය වන මෙම මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සොයා බැලීම ඉතාමත් වැදගත්ය.

2022 වර්ෂය ශ්‍රී ලංකාවට ඉතාමත් තීරණාත්මක විය. රටෙහි පැවැති ආර්ථික දේශපාලන බිඳවැටීම හේතුවෙන් ඇතිවූ ව්‍යාකූලභාවය හේතුවෙන් මිනිස්සු පාරට බැස අරගල කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුව විසින් එල්ල කරන ලද මර්දනකාරී වැඩපිළිවෙළෙහිදී මිනිසුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට පටන් ගත්තේය. එම අවස්ථාවේ මිනිසුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඉදිරිපත් වීම ඉතාමත් ප්‍රශංසනීය මට්ටමින් දැක ගත හැකි විය. දිනපතා සිදු වූ මානව හිමිකම් උල්ලංඝනයන් කෙරෙහි නිරන්තර අවධානය යොමු කරමින් ඒවාට අවශ්‍ය පියවර ගැනීම, ඒවා නොකරන ලෙස රජයට බලපෑම් කිරීම වැනි කාරණා එහිදී දැකගත හැකි විය.

අනෙකුත් මානව හිමිකම් කඩවීම් කෙරෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සොයා බැලීමේදී පෙනී ගියේ 2019 සිට ශ්‍රී ලංකාවේ එක් එක් කාර්තුවලදී සිදුවූ ව්‍යසනයන්, පාස්කු ප්‍රහාරය, කෝවිඩ් වසංගත වැනි තත්ත්වයන් හේතුවෙන් පනවන ලද ඇඳිරි නීති හා ගමනාගමනය සීමා කිරීම් හේතුවෙන් විභාගයට ගැනීමට නොහැකි වූ පැමිණිලි විශාල ප්‍රමාණයක් 2022 වන විට විමර්ශන කිරීමට ඉතිරිව ඇති බවය. එසේම නිලධාරීන්ගේ හිඟය හේතුකොට ගෙන ඒම තත්ත්වය තව උත්සන්න වී ඇති බවත් පෙනී ගියේ ය.

කෙසේ වෙතත් මේවාට විසඳුම් ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව අලුතෙන් නිලධාරීන් බඳවා ගෙන ඇති අතර, පරණ ඉතිරිව ඇති පැමිණිලි විමර්ශනය සඳහා කැඳවීම් කරන අතරවාරයේ ම, 2022 අලුත් පැමිණිලි කඩිනම් විමර්ශන සඳහා ද කැඳවීම් කරන බව පෙනී යයි. මෙය සාධනීය තත්ත්වයකි.

ඒ කෙසේ වෙතත් පැමිණිලි විභාග කිරීමේ ක්‍රියාවලිය හා නිර්දේශ ලබා දීමේ ක්‍රියාවලිය දෙස බැලූ විට තවමත් යම් යම් ගැටලු ඇති බව පෙනී යයි. පොදුවේ ගත්කළ මානව හිමිකම් කොමිසම පැමිණිල්ලක් විමර්ශනය කිරීමේදී ඊට අදාළ පාර්ශවයන් කැඳවූ පසු එහි ඊළඟ කැඳවීම් දිනය පිළිබඳ එදින දැනුම් දීමක් සිදු නොකරන අතර එය නැවත දැනුම් දීමේදී අනුගමනය කරන තේරීම් ක්‍රම වේදය, යාන්ත්‍රණය කුමක්ද යන්න ගැටලු සහගතය. බොහෝ අවස්ථාවලදී පළමු විමර්ශන දිනයට පාර්ශවකරුවන් කැඳවූ පසු එහිදී ප්‍රශ්නය නිරාකරණය නොවන අතර එහි ඊළඟ කැඳවීම් දිනය පාර්ශවකරුවන්ට දැනුම් දෙන්නේ මාස ගණනාවක් නැතහොත් වර්ෂ කිහිපයක් ගත වීමෙන් පසුවය. ඒ වන විට අදාළ වින්දිතයින්ගේ උද්‍යෝගිමත්කම පහව ගොස් ඔවුන් තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීමේ අරගලයෙන් ඉවත්ව සිටින අවස්ථා බොහෝ වේ. එසේම අනෙක් අතට මේ තුළින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන්ට වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් තව තවත් ශක්තිමත් වන අතර ඔවුන් තමන් අනුගමනය කරන නීතියට පටහැනි ක්‍රියාවන් දිගටම කරගෙන

යාමට උඩගෙඩි සපයන්නක්ද විය හැක. එබැවින් මෙම දුර්වලතා මගහරවාගෙන විධිමත් වූ මානව හිමිකම් සුරක්ෂිත යාන්ත්‍රණයක් උදෙසා පහත නිර්දේශයන් යෝජනා කර සිටිමු.

1. පැමිණිලි විභාගය කෙටි කලක් තුළ අවසන් කිරීම තුළින් වින්දිතයාට ඉක්මන් සහනයක් ලබා දීමට කටයුතු කිරීම.

2. පැමිණිලිවලට අදාළ විමර්ශනයන් සඳහා ස්වාධීන විමර්ශන ඒකකයක් පිහිටුවීම හා ඒ තුළින් මෙම ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසනීයත්වයක් හා අපක්ෂපාතී භාවක් ඇති කිරීමට කටයුතු කිරීම.

3. පක්ෂග්‍රාහී හෝ තොරතුරු අනාවරණය කරනු ලබන කොමිසමේ නිලධාරීන්ට එරෙහිව නීතිය බලාත්මක කිරීම.

4. පුද්ගලයින් රඳවා තබා ගන්නා ස්ථානයන්ට ක්ෂණික සංචාරයන් කිරීම හා එම ස්ථානයන් පිළිබඳ නිරීක්ෂණයන් වැඩි කිරීම.

5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ හදිසි නීති රෙගුලාසි යටතේ සිදු කරනු ලබන අත්අඩංගුවට ගැනීම් පිළිබඳව කොමිසමේ මැදිහත් වීමට නීතිමය බලාත්මක භාවයක් ලබා දීම.

6. නිර්දේශයන් ප්‍රදානය කිරීමෙන් පසුව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමසා බැලීමට අංශයක් පිහිටුවීම.

7. නිර්දේශයන්ට නෛතික බලාත්මක භාවයක් ලබා දීම මගින් ලබා දුන් නිර්දේශයන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කර ගැනීමට හැකියාවක් ලබා ගැනීම හා එම නිර්දේශන් ක්‍රියාත්මක නොකරන්නන් කෙරෙහි නීතිය බලාත්මක කිරීම අවස්ථාවක් ලබා ගැනීම.

## ආශ්‍රිත නාමාවලිය

1. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත. https://hrcsl.lk/wp-content/uploads/2023/01/HRCSL-Act-Sinhala.pdf

2. Democracy, R. N. C. F. (n.d.). මානව හිමිකම් කොමිසම කුමක්ද? - සමබිම වෙබ් අඩවිය. https://www.samabima.com/?p=21589

3. Liyanaarachchi, J., & Dissanayake, D. (2020). ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා: ඉතිහාසය, බලතල, ක්‍රියාකාරීත්වය සහ ස්වභාවය [Sinhala]. PAFFREL.

4. GANHRI Sub-Committee on Accreditation Report – October 2021. SCA reports - GANHRI

**ඇමුණුම 1**

| මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථානය | පැමිණිලිකරුගේ නම, ස්ත්‍රී පුරුෂ භාවය | පැමිණිලි වර්ගය | | | | | වග උත්තරකරු කවුද යන වග | පැමිණිල්ල යොමු කළ දිනය | කොමිසමේ ලියාපදිංචි වූ දිනය සහ ලියාපදිංචි අංකය | කොමිසම විමසීම් පැවැත්වූ දිනයන් සහ ඒවායේ වින්දිතයාට දැන ගැනීමට හැකි වූ තොරතුරු | කොමිසම විමසීම් පවත්වා තිබේද සහ වින්දිතයාට දැනගැනීමට ලැබී ඇති වත්මන් තත්වය | කොමිසම නිර්දේශ ලබා දී තිබේද තිබේ නම් ලබා දී ඇති දිනය | කොමිසමට පැමිණිලි කිරීම හේතුකොට ගෙන වින්දිතයාට කුමක් හෝ විසඳුමක් හෝ සහනයක් ලැබී තිබේද |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වධහිංසනය | නීතිවිරෝධී ඝාතන | නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම | නීතිවිරෝධී රඳවා ගැනීම | පරිපාලන නිෂ්ක්‍රියතා | | | | | | | |
| 01) ගම්පහ | දීපානි දිල්රුක්ෂි ස්ත්‍රී | | | | | X | රාගම පොලිස් ස්ථානය | 2022/08/02 | 2022/08/31 HRC/3363/ 22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 02) ගම්පහ | ලසන්ත චාමින්ද පුරුෂ | | | | | X | ජා ඇල පොලිස් ස්ථානය | 2022/08/10 | 2022/09/11 HRC/HO/ 0325/22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 03) ගම්පහ | පද්මා මැණිකේ ස්ත්‍රී | | | | | X | රාගම පොලිස් ස්ථානය | 2022/08/16 | 2022/09/29 HRC/MO/ 1838/22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 04) ගම්පහ | චිත්‍රාංගනී ප්‍රියංකා ස්ත්‍රී | | | | | X | කම්කරු කාර්යාලය, නාරාහේන්පිට. | 2022/08/16 | 2022/10/08 HRC/HO/ 1938/22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 05) ගම්පහ | ඩී.සී. ඩැනිෆියුස් පුරුෂ | | | | | X | කෑගල්ල පොලිස් ස්ථානය | 2022/11/12 | 2022/11/25 HRC/HO/ 4657/22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06) ගම්පහ | ධම්මිකා වීරවර්ණ ස්ත්‍රී | | | | | X | රාගම ප්‍රාදේශීය සභාව | 2022/11/14 | 2022/11/25 HRC/2910/ 22 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | නැත | නැත |
| 07) ගම්පහ | නිරූපා සුභාෂිණී ස්ත්‍රී | | | | | X | ජා ඇල පොලිස් ස්ථානය | 2022/10/02 | 2022/10/30 HRC/MO/ 5327/ 22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 08) ගම්පහ | චන්ද්‍රිකා ප්‍රියන්ති ස්ත්‍රී | | | | | X | ජා ඇල පොලිස් ස්ථානය | 2022/10/06 | 2022/11/01 HRC/ 118/ 4098/22 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 09) කුරුණෑගල | රේණුකා මල්කාන්ති ස්ත්‍රී | | | | | X | පොල්ග හවෙල පොලිස් ස්ථානය | 2022/12/06 | 2022/12/20 HRC/110/ 5087/22 කොළඹ කාර්යාලය | අදාළ විමර්ශන සිදුකරමින් පවතින බව කොමිසම 2023/01/11 වන දින දුරකථන මාර්ග යෙන් වින්දිතයා වෙත දන්වා ඇත. | ඒ අනුව 2023/01/25 වන දිනට පෙර කොමිසම වෙත පැමිණ ප්‍රකාශ ලබා දිය යුතු බව මෙහි වගඋත්තරකාර පාර්ශවය වන පොල්ගහවෙල පොලිස් ස්ථානය වෙත දන්වා ඇත. | නැත | නැත |
| 10) කුරුණෑගල | ශාන්ති හේමලතා ස්ත්‍රී | | | | | X | වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2023/02/21 | 2023/03/07 HRC/HO/ 1015/23 කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පැවැත්වූ විමර් ශනයෙන් වින්දිතයාගේ ගැටළුව නිරාකරණය වී තිබේ. |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11) කුරුණෑගල | විජිත බණ්ඩාර බස්නායක පුරුෂ | | | | | X | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2022/09/01 | 2022/09/07 HRC/HO/ 13834/22 කොළඹ කාර්යාලය | 2022/11/23 වන දින කොමිසම ලිපියක් මගින් වින්දිතට දන්වා ඇත්තේ පැමිණිල්ල සම්බන්ධයෙන් පිළිතුරු ඒවන ලෙසට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලිඛිතව දන්වා ඇති බවයි. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 12) කුරුණෑගල | පසිඳු ධනංජය පුරුෂ | | | | | X | පන්නල පොලිස් ස්ථානය | 2022/12/27 | 2023/01/11 HRC/ HO/5387/22 කොළඹ කාර්යාලය | 2023/01/11 නිකුත් කෙරූ ලිපියෙන් පැමිණිල්ල ලියා පදිංචි කර ඇති බවත් ඒ සඳහා කොමිසමේ අවධානය යොමු වී ඇති බවත් දන්වා තිබේ. | නැත | නැත | නැත |
| 13) කුරුණෑගල | මාටින් කරුණාරත්න පුරුෂ | | | | | X | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | 2022/08/03 | 2022/09/15 HRC/HO/ 3112/22 කොළඹ කාර්යාලය | 2022/10/25<br>2022/11/30 | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 14) කුරුණෑගල | චන්දන සිසිර කුමාර පුරුෂ | | | | | X | කුරුණෑගල මහනගර සභාව | 2022/12/20 | - | කොමිසමෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 15) කුරුණෑගල | ශිරාණි ස්වර්ණලතා ස්ත්‍රී | X | | | | | කෑගල්ල බන්ධනාගාරය | 2022/11/01 | HRC/HO/4638I | මානව හිමිකම් කොමිසමේ කොළඹ කාර්යාලය මඟින් වැඩිදුර විමර්ශන කටයුතු සඳහා නුවර කාර්යාලය වෙත භාර දී තිබේ. | විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී. | නැත | වධහිංසා පැමිණ වූ බන්ධනාගා--රයෙන් එම වින්දිතයාව වෙනත් බන්ධනාගා--රයක් වෙත මාරු කර තිබේ. |
| 16) කුරුණෑගල | රවින්ද්‍ර ඒකනායක පුරුෂ | | | | | X | ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය | 2022/11/30 | 2023/01/10 HRC/HO/ 5388/22 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 17) කුරුණෑගල | ඩබ්.ඒ. ගාමිණි ජයසූරිය පුරුෂ | | | | | X | රිදීගම රාජකීය විද්‍යාලය | 2022/10/11 | 2022/11/18 HRC/HO/4409/22 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 18) කුරුණෑගල | කේ.එස්. ප්‍රේමදාස පුරුෂ | | | | | X | මාර්ග සංවර්ධන අධිකාරිය | 2022/10/17 | - | කොමිසම විසින් ඔවුන්ට මෙම පැමිණිල්ල අදාල නොවන බව දන්වා තිබේ. නැවතත් ඒ සම්බන්ධව පැමිණිල්ලක් යොමු කර තිබේ. | නැත | නැත | නැත |
| 19) කුරුණෑගල | එච්. එම්. ඩී. කේ. බී. පහළගම පුරුෂ | | | | | X | වැල්ලව පොලිස් ස්ථානය | 2022/10/17 | 2022/10/26 HRC/HO/4053/22 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 20) කුරුණෑගල | එම්.පී.ඩී. අමරතුංග පුරුෂ | | | | | X | මාර්ගස්ත මගී ප්‍රවාහන අධිකාරිය | 2022/10/25 | 2022/11/07 HRC/HO/4195/22 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 21) කුරුණෑගල | එච්.එම්.ඊ. චතුරානි දසනායක ස්ත්‍රී | | | | | X | තැපැල් දෙපාර්තමේන්තුව | 2023/01/10 | 2023/02/08 HRC/HO/321/23 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 22) කුරුණෑගල | එච්.එම්. හීංමැණිකේ ස්ත්‍රී | | | | | X | කුඹුක්ගෙටේ පොලිස් ස්ථානය | 2023/01/27 | 2023/02/15 HRC/HO/ 573/23 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 23) කුරුණෑගල | එච්. එම්. සරත් විපුල බණ්ඩාර පුරුෂ | | | | | X | ගොකරැල්ල පොලිස් ස්ථානය | 2023/02/01 | 2023/03/08 HRC/HO/996/23 කොළඹ කාර්යාලය | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 24) කුරුණෑගල | ආර්.ඩී. චන්දන කුමාර ජයලත් පුරුෂ | | | | | X | රිදීගම ප්‍රාදේශීය ලේකම් | 2022/10/11 | 2022/11/23 HRC/HO/ 4590/22 කොළඹ කාර්යාලය | විමර්ශනය අවසන් කර ඇති බව වින්දිතට දන්වා ඇත. | විමර්ශනය අවසන් කර ඇති බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 25) ගාල්ල | අලවත්තගේ තිලකරත්න පුරුෂ | | | | | X | අක්මීමණ පොලිස් ස්ථානය | 2022/04/27 | 2022/05/17 HRC/MT/ 171/22/V මාතර කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 26) ගාල්ල | යු. එල්. අමිල රුවන් උදයංග පුරුෂ | | | X | X | | පිටිගල පොලිස් ස්ථානය | 2022/11/23 | HRC/ MT/333/22/G මාතර කාර්යාලය | පැමිණිල්ලට අදාළ විමර්ශනය සඳහා 2023.05.12 වන දින මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත කැඳවා ප්‍රකාශ සටහන් කරගෙන තිබේ. | විමර්ශන සිදුකරමින් පවතින බව වින්දිතට දන්වා ඇත. | නැත | නැත |
| 27) ගාල්ල | හපුතන්ත්‍රිගේ ගයාන් ලසන්ත පුරුෂ | | | | | X | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2022/08/19 | - | මානව හිමිකම් කොමිසමෙන් ප්‍රතිචාර ලැබී නැත. නමුත් එම ගැටලුව මේ වන විට විසඳී ඇත. | නැත | නැත | නැත |
| 28) ගාල්ල | සූදුව හේවගේ සමන්ත පුෂ්පකුමාර පුරුෂ | | | | | X | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2022/06/01 | - | මානව හිමිකම් කොමිසමෙන් ප්‍රතිචාර ලැබී ඇති නමුත් ගැටලුව විසඳී නොමැත. අදාල චක්‍ර ලේඛනය අනුව ලමුන් බඳවා ගෙන ඇති බවට දන්වා තිබේ. | නැත | නැත | නැත |
| 29) ගාල්ල | හිනිදුම ලියනගේ චමරි සඳරේඛා ස්ත්‍රී | | | | | X | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2022/05/09 | - | මානව හිමිකම් කොමිසමෙන් ප්‍රතිචාර ලැබී ඇති නමුත් වෙනත් ක්‍රමවේදයකින් මේ වන විට ගැටලුව විසඳී ඇත. | නැත | නැත | නැත |
| 30) ගාල්ල | රමණි සිරියලතා ස්ත්‍රී | X | | | | | පිටිගල පොලිසිය | 2022/08/18 | 2022/10/04 HRC/ HO/3429/22 | 19/05/2023 මාතර<br>08/06/2023 කොළඹ | දැනට අවස්ථාවන් දෙකකදී විමර්ශන කටයුතු සඳහා කැඳවා තිබේ. | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 31) පුත්තලම | රේණුකා නිමාලි ස්ත්‍රී | | | | | X | ප්‍රාදේශීය ලේකම් ආනමඩුව | 2021/10/25 | 2022/01/18 HRC/HO/ 2756/21 පුත්තලම කාර්යාලය | 2022/08/30 | විමර්ශන පවත්වා ඇත. | නැත | සමථ වී ඇත. |
| 32) පුත්තලම | රන්දු චන්දිමාල් පුරුෂ | | | | | X | ජල සම්පාදන මණ්ඩලය | 2022/08/12 | - | පුත්තලම මානව හිමිකම් කාර්යාලය වෙත පැමිණිලි කර ඇති අතර පැමිණිල්ල භාර ගෙන නොමැත. | නැත | නැත | නැත |
| 33) පුත්තලම | ශානිකා කුමාරි සෝමරත්න ස්ත්‍රී | | | | | X | මුන්දලම පොලිසීය | 2022/09/18 | - | මානව හිමිකම් කාර්යාලයට පැමිණිලි කිරීමෙන් පසුව මුන්දලම පොලිසීය වෙත පැමිණිලි විභාග කිරීමට කැඳවා තිබේ. | නැත | නැත | නැත |
| 34) පුත්තලම | ඩී.එල්.ඩී. ශෙල්ටන් නවරත්න පුරුෂ | | | | | X | තබ්බෝව ව්‍යාපාර අධිකාරී කාර්යාලය | 2022/10/22 | - | විමර්ශනයට කැඳවා නැත. අනෙක් පාර්ශවයෙන් පමණක් කරුණු විමසා ඇත. | නැත | නැත | නැත |
| 35) දෙනියාය | සිරිසේන හෑගොඩ පුරුෂ | | | X | X | | කොස්මෝදර පොලීසිය ස්ථානය | 2022/05/12 | 2022/07/22 HRC/ MT/344/22/V මාතර කාර්යාලය | අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහය දීමේ හා ආරක්ෂා කිරීමේ යටතේ මෙහි පැමිණිලිකරුවන්ට එරෙහිව නඩු පවරා ඇති බව අනාවරණය වන බැවින් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවූ ලෙසට සලකා කටයුතු කල නොහැකි බව දන්වා ගොනුවී කටයුතු අවසන් කරන බවත් ඇප ලබා ගැනීමේ කාර්යයට කොමිෂන් සභාවට මැදිහත්ව කටයුතු කල නොහැකි බව වැඩිදුරටත් දන්වා තිබේ. | නැත | නැත | නැත |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 36) මාතර | ගයාන් ෂම්මි චන්ද්‍රදාස මහගම්මුල්ලේ ගමගේ<br>පුරුෂ | | | | | X | මාතර පොලිස් ස්ථානය | 2022/07/15 | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. |
| 37) මාතර | රොනල්ඩ් ජයවර්ධන පුරුෂ | | | | | X | ඉමදූව පොලිස් ස්ථානය | 2022/07/26 | 2022/09/15 HRC/HO/ 2968/22 කොළඹ කාර්යාලය | 2023/01/26 2023/03/02 | විමර්ශන පවත්වා ඇත. | නැත | නැත |
| 38) මාතර | නිශාන්ත සමන් කුමාර<br>පුරුෂ | | | | | X | ඉමදූව පොලිස් ස්ථානය | 2022/08/23 | 2022/12/19 HRC/HO/ 3918/22/G කොළඹ කාර්යාලය | නැත | නැත | නැත | නැත |
| 39) මාතර | බෙත්මි රුකේෂියා සිල්වා<br>ස්ත්‍රී | | | | | X | ගන්දර පොලිස් ස්ථානය | 2022/09/05 | 2022/09/06 HRC/MTR/ 329/22/G මාතර කාර්යාලය | 2022/09/06 නිකුත් කෙරූ ලිපියෙන් පැමිණිල්ල ලියා පදිංචි කර ඇති බවත් ඒ සඳහා කොමිසමේ අවධානය යොමු වී ඇති බවත් දන්වා තිබේ. | නැත | නැත | නැත |
| 40) මාතර | හංසක දේශාන්<br>පුරුෂ | X | | | | | තිහගොඩ පොලිසිය | 2022/10/28 | 23/11/2022 HRC/ MTR/428/22/V | විමර්ශන සිදුවෙමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | විමර්ශන සිදුවෙමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | නැත | නැත |
| 41) ත්‍රිකුණාමලය | රංජිත් ගුණසේකර<br>පුරුෂ | X | | | | | අග්බෝපුර පොලිස් ස්ථානය, කන්තලේ. | 2022/09/12 | 2022/09/13 HRC/TRM/ 86/2022 ත්‍රිකුණාමලය කාර්යාලය | විමර්ශන සිදුවෙමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | විමර්ශන සිදුවෙමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | නැත | සිද්ධියට වගකිවයුතු නිලධාරීන්ව ස්ථාන මාරු කොට තිබේ. |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 42) ත්‍රිකුණාමලය | එම්.ජී. ශිරෝමා<br><br>ස්ත්‍රී | | | | | X | ශ්‍රී ලංකා මහබැංකුව | 2022/06/25 | 2022/07/05 HRC/TRM/ 32/2022 ත්‍රිකුණාමලය කාර්යාලය | විමර්ශන සිදු කර තිබේ. | විමර්ශන සිදු කර තිබේ. | නැත | වින්දිතයා LOLC ආයතනයෙන් ලබා ගෙන තිබූ ණය මුදල නිසියාකාරව ගෙවා අවසන් කර තිබුනද ඊට අදාළ ඉඩම් ඇපය LOLC ආයතනය විසින් නිදහස් කර තිබුනේ නැත. පසුව මානව හිමිකම් කොමිසමට සිදු කළ පැමිණිල්ල ප්‍රකාරව කොමිසමේ මැදිහත් වීම මත ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වී අදාළ ඉඩම් ඔප්පුව වින්දිතයාට නිදහස් කර දී තිබේ. |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 43) ත්‍රිකුණාමලය | සුරංග රූපසිංහ<br>පුරුෂ | | | | | X | වෙරුගල් ප්‍රාදේශීය සභාව | 2022/06/25 | 2022/10/04 HRC/2982/ 22 ත්‍රිකුණාමලය කාර්යාලය | කොමිසම මගින් විමර්ශන සිදුකරමින් පවතින බව 2022/10/04 වන දින යොමු කර ඇති ලිපියක් මගින් වින්දිතයා වෙත දන්වා ඇත. | කොමිසම මගින් විමර්ශන සිදුකරමින් පවතින බව 2022/10/04 වන දින යොමු කර ඇති ලිපියක් මගින් වින්දිතයා වෙත දන්වා ඇත. | වෙරුගල් ප්‍රාදේශීය සභාවේ ඉලංගතුරෙයි ගම්මානයට පාලම් පාරුවක් ලබා දී එය ක්‍රියාත්මක කරන ලෙස ප්‍රාදේශීය සභාව වෙත නිර්දේශ කොට ඇත. | වෙරුගල් ප්‍රාදේශීය සභාවේ ඉලංගතුරෙයි ගම්මානයට පාලම් පාරුවක් ලබා දී එය ක්‍රියාත්මක කරන ලෙස ප්‍රාදේශීය සභාව වෙත නිර්දේශ කොට ඇත. ඒ අනුව ගැටළුව විසඳී ඇත. |
| 44) ත්‍රිකුණාමලය | එස්. ෂන්මුගප්‍රියා<br>ස්ත්‍රී | X | | | | X | අග්බෝපුර පොලිස් ස්ථානය, කන්තලේ | 2022/09/06 | 2022/09/16 HRC/TRM/ 91/2022 ත්‍රිකුණාමලය කාර්යාලය | 2022/09/21 | 2022/09/21 වන දින ත්‍රිකුණාමලය කාර්යාලය වෙත වින්දිතයාව කැඳවා ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. තවද මේ සම්බන්ධයෙන් විමර්ශන සිදු කෙරෙමින් පවතින බව දන්වා ඇත. | නැත | පොලිස් බුද්ධි අංශ මගින් සිදු කළ බලපෑම් නතර වී තිබේ. |
| 45) ත්‍රිකුණාමලය | එල්. ජී. වී. සී. පියදාස<br>පුරුෂ | | | | | X | අග්බෝපුර පොලිස් ස්ථානය, කන්තලේ | 2022/11/03 | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. | වින්දිතයාගෙන් ප්‍රතිචාරයක් නොමැත. |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 46) ත්‍රිකුණාමලය | සෙනෙවිරත්න බංඩා<br><br>පුරුෂ | | | | | X | කන්තලේ පොලිස් ස්ථානය | 2021/12/14 | 2022/01/21 HRC/HO/ 2888/21 ත්‍රිකුණාමලය කාර්යාලය | 2022/03/08 2022/10/13 | විමර්ශන සිදුවෙමින් පවතින බව වින්දිතයාට දන්වා ඇත. | නැත | සිද්ධියට වගකිව යුතු පොලිස් නිලධාරීන්ට මඩකලපුව පොලිස් ස්ථානය වෙත ස්ථාන මාරු ලබා දී ඇති බව වින්දිතයාට දැනගැනීමට ලැබී ඇත. |
| 47) කළුතර | රාමනාදන් කුලසේකරන්<br><br>පුරුෂ | X | | X | X | | තෙබුවන පොලිසිය | - | 2022/10/25 HRC/ HO/4068/22 | 2023/05/08 | විමර්ශන සිදුකරමින් පවති | නැත | නැත |
| 48) කළුතර | R.G.R.D රාජපක්ෂ<br><br>ස්ත්‍රී | X | | X | X | | ඉත්තැපාන පොලිසිය | 2022/10/30 | 2022/11/03 HRC/5137/22 | 21/06/2022 | විමර්ශන සිදුකරමින් පවති | නැත | නැත |
| 49) කොළඹ | දොන් නුවන් මදුරංග<br><br>පුරුෂ | | | X | X | | ඉත්තැපාන පොලිසිය | 2023/03/04 | 2023/03/07 HRC/ HO/1052/23 | - | විමර්ශන සිදුකරමින් පවති | නැත | නැත |
| 50) කොළඹ | ඩිබි.ජී. අජිත් කුමාර<br><br>පුරුෂ | X | | X | | | කළුතර දකුණ පොලිස් ස්ථානය | 2022/08/30 | විමර්ශනය සඳහා කැඳවන ලදි. 2022/09/01 HRC/ HO/3056/22 | - | විමර්ශන සිදුකරමින් පවති | නැත | නැත |

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

අංක 56/2, පාලිත පෙදෙස, කොළඹ 09, ශ්‍රී ලංකා.

Tel/Fax: +94 112 669100

Email: right2lifelk@gmail.com

Websites: www.right2lifelanka.org www.aithiya.lk www.dailyreporter.lk www.slcat.org

Facebook pages: Right to Life Sri Lanka | Aithiya | Daily Reporter

Youtube: Aithiya Media